# The Magazine by පෙරමග

2019 ජුනි - පළමුවන කලාපය

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයට අනුබද්ධ දශක කණ්ඩායමක් වන පෙරමග දශක කණ්ඩායම විසින් සම්පාදිතයි.


04 පිටුව පෙරමං සලකුණු





15 පිටුව ධම්පල් අතීත පිය සටහන්...

03 පිටුව ක්‍රීඩාපිටිය සංවර්ධනය


11 පිටුව ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය ලබාගැනීම


12 පිටුව ජාතික තලය දිනූ ධම්පල් ක්‍රීඩා තරුව


03 පිටුව සෙල්ලම් මිදුල සංවර්ධනය

04 පිටුව පෙරමං තැනූ සහෘද පෙරගමන්කරුවන්...

07 පිටුව 2019 රන් සිංහ සටනේ ජය ධර්මපාලයට

08 පිටුව 2019/2020 වර්ෂයේ වැඩසටහන් පෙලගැස්ම


14 පිටුව ලක්දිව නම රැන්දූ ව්‍යාපාරිකයෙක්!

14 පිටුව අකුරු කල සිතුවිලි

15 පිටුව OFFICIAL DHARMAPALA MERCHANDISES



PERAMAGA DECADE GROUP
Past Pupils' Association
Dharmapala Vidyalaya, Pannipitiya.
Web : www.peramaga-dvp.org
E mail : peramaga.dvp@gmail.com
Contact : 077 665 6628





පෙරමග දශක කණ්ඩායම

# විධායක සභාව 2019/2020

**සභාපති** බුද්ධික රොෂාන් - 0776 656 628

**ලේකම්** ගයානි කොස්වත්තගේ - 0714 445 772

**ප්‍රධාන උප සභාපති**
සුලක්ෂණ විදුරංග - 0718 809 315

**උප සභාපති**
පෙවින්ද බැලගම - 0715 826 985
දිලීප තුෂාර - 0713 082 447

**ප්‍රධාන උප ලේකම්**
නිශාදි රුක්ෂානි - 0718 513 098

**උප ලේකම්**
දිනේෂා ජයමාන්න - 0766 661 080
ශමේන්ද්‍ර ධර්මසේන - 0777 673 805

**භාණ්ඩාගාරික** වෙනුර කසුන්සිරි - 0774 527 005

**උප භාණ්ඩාගාරික**
චමිදු විජයවර්ධන - 0718 984 600

**සංවිධායක**
ශිවන්ත කොස්වත්තගේ - 0777 787 548

**උප සංවිධායක** කසුන් මධුෂංක - 0772 387 474

**සංස්කාරක** ධනංජ ඇල්විටිගල - 0711 050 234

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
රසික මධුසංක - 0715 344 333

**කාරක සභිකයින්**
චරිතා සෙනෙවිරත්න, අමිල මෛත්‍රීපාල, අප්සරා මධුවන්ති, වරුණ විජයසේකර, දිලිනි ලාංකිකා ලියනගේ, ගීතක පෙරේරා, රෝෂන් මදුශංක, තිළිණි තිලකරත්න, සුමුදු ගීගනගේ, රංග ඩිලාන් පෙරේරා, මේබලා ප්‍රනාන්දු, ජේ.ඩබ්.එන්. සාලින්ද, ජේ.එම්.ජී.ටී. ජයසේකර, අරුණි ලියනගේ, නදීශා රාජිනි, යසන්ත ඉන්දීවර, කවීන්ද්‍ර තිස්ස, ආර්.එම්.ජී.අයි. අනුරුද්ධිකා ගිහාන් චතුරංග, හර්ෂ රණසිංහ

**හිටපු සභාපති** රුසිරු බැලගම - 0777 664 626

The Magazine by පෙරමග

2019 ජූනි - පළමුවන කලාපය

**සංස්කරණය** ධනංජ ඇල්විටිගල

**විශේෂාංග ලිපි සැකසීම**
දිනේෂා ජයමාන්න (1)
අරුණි මහේෂිකා ලියනගේ (2)
සංජය ද සිල්වා (3)
චරිතා සෙනෙවිරත්න (4)
හියල් චතුර බියගමගේ (5)
කල්පිත කෝදාමුල්ල (6)
මේබලා නදීශානි ප්‍රනාන්දු (7)
තිළිණි ශ්‍යාලිකා තිලකරත්න (8)
දිලිනි ලාංකිකා ලියනගේ (9)
රවී නන්දන ගමාච්චිගේ (10)
තිවංකා මදුරංගි (11)
නිශාදි රුක්ෂානි (12)

**පරිගණක අකුරු ඇමුණුම**
තිළිණි ශ්‍යාලිකා තිලකරත්න (8)
සමුද්‍රිකා සේනාධීර (13)

**නිර්මාණකරණය** ධනංජ ඇල්විටිගල
ĐandÅart Creations

**සෝදුපත් පරීක්ෂාව**
අරුණි මහේෂිකා ලියනගේ (2)
දිනේෂා ජයමාන්න (1)
චමිදු විජයවර්ධන (14)
මේබලා නදීශානි ප්‍රනාන්දු (7)

**අනුශාසක මණ්ඩලය**
වෙනුර කසුන්සිරි (15)
රුසිරු වගීෂ බැලගම (16)



පෙරමග දශක කණ්ඩායමේ

## සභාපතිතුමාගෙන් වචනයක්...

පෙර විසූවන්ගෙන් පටන් පැවසෙන්නා වූ ලෙස 'පෙරඹරින් ප්‍රභාකර නැගෙන්නටත් පෙර පෙරදිග ඇත්තන් අවදි වූවා' සේ දම්පල් විදු මව්න්ගේ පෙරමගට රිසි දේ පෙරතියාම දැක නිසි ලෙසට සොයා සපයා දීමට සැමට පෙරාතුව ම අවදි වී පෙරමගට බසින්නෝ පෙරමග අපියි. පෙර සේ ම අදටත් එය එසේමය. මතුවටත් එය එසේම වනු ඇත. මන්ද පෙරමග දිග්විජය කළ හැකි පෙරටුගාමී සවිමත්ම බල ඇණිය සිටින්නේ අප සතුව බැවිනි. ජපන් හයිකුවක වුවත් පෙර-අපර සන්ධි ගැලපීමට රුසි හැන්ඩි-ඩැන්ඩි හුරුබුහුටියන් සිටින්නේ අප සතුව බැවිනි.

පෙරමග හෙලිපෙහෙලි කරන අපගේ එකමුතුකමේ සවිය අවියක් වුවත් කවියක් තරම් මිහිරි ය. අප සතු සුවිසල්ම වත්කම වූ අපගේ හිතවත්කම ගතසිත සනසන පවනක් තරම් සිසිල ය.

ඒ සවියෙනුත් වත්කමෙනුත් සැදි පෙරමග නෞකාව සියල් සැඩසුළං කුණාටු අභිබවා පෙරමග කරා යන ගමනේ අසිරිය කොල කිහිපයකට සිතුවම් කර අද ඔබ අතට මෙසේ පත්වන්නේත් අප පෙරමග තනන්නන්ගේ ම අමිල පරිශ්‍රමයෙනි. ඒ සාඩම්බර පෙරගමනට සුබාසිරි පෙරදැරිව ඊළඟ නැංගුරම්ලන තොට තෙක් පෙරමුණ ගැනීමට හැකිවීම මා ලද භාග්‍යයක්මැයි.

**බුද්ධික රොෂාන්** - සභාපති - පෙරමග දශක කණ්ඩායම



පෙරමග දශක කණ්ඩායමේ

## ලේකම්තුමියගෙන් වචනයක්...

ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ශක්තිමත් ම දශක කණ්ඩායම වන පෙරමග නම් වූ අප, අපගේ දොළොස්වන සංවත්සරය සමඟින් කුළුදුලේ ඔබ අතට පත් කරන "පෙරමග පුවත් සඟරාවට" මාගේ සුභාශිංසන එකතු කරන්නේ හද පිරි සතුටිනි. මෙම නැවුම් වූ අත්දැකීම සිහිනයක් නොවී යථාර්ථයක් බවට පත් කර ගැනීමට සහයෝගය ලබා දුන් විදුහල්පතිතුමාටත්, විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු සාමාජික සාමාජිකාවන්ටත්, මෙම සඟරාව වෙනුවෙන් දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වූ අපගේ පෙරමග සොයුරු සොයුරියන්ටත් නන් අයුරින් සහය දුන් සැමටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

**ගයනි කොස්වත්තගේ** - ලේකම් - පෙරමග දශක කණ්ඩායම



පෙරමග දශක කණ්ඩායමේ

## සංස්කාරකතුමාගෙන් වචනයක්...

පෙරමග දශක කණ්ඩායම මගින් සිදුකළ, සිදුකරන සහ සිදුකිරීමට බලාපොරොත්තුවන ව්‍යාපෘති පිළිබඳව ආදි ශිෂ්‍යයින් ඇතුළු ආදි ශිෂ්‍ය සංගමය වටා එක් රොක් වී සිටින පිරිස දැනුවත් කිරීමට ද සාමාජිකයාට පෙරමග දශක කණ්ඩායමේ ස්වභාවය පිළිබඳව අදහසක් ලබා දීමට ද මෙම පුවත් සඟරාව පිටුවහලක් කරගනිමි. පෙරමග අරටුව හෙවත් පෙරමග සහෝදර ශක්තිය මා හට මෙම කාර්යයේදී අවශ්‍ය වේලාවේ දී අවශ්‍ය අයුරින් ම ලැබුණු බව ඉතා සතුටින් සඳහන් කරමි. එය පෙරමග අනෙක් ඕනෑම කටයුත්තක දී මෙන් ම මෙවර ද නොඅඩුව දැනුණි. සඟරා කමිටුවේ සිටි සාමාජිකයින් පමණක් නොව, අප විද්‍යාලයේ විදුහල්පතිතුමාත්, ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමා, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු අනෙකුත් සාමාජිකයිනුත්, ආදි ශිෂ්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩලයත් මෙම කර්තව්‍ය සාර්ථක කරගැනීමට හදවතින්ම උදව් උපකාර කරමින් ආශිර්වාදයක් වූ බවට සඳහන් කරමි. එමෙන්ම පෙරමග දශක කණ්ඩායම ආරම්භයේ සිට ම පෙරමග තැනූ පෙරමග ජ්‍යෙෂ්ඨයින්ටද ස්තුතිවන්ත වෙමි. මන්දයත් සෑම අතින් ම ශක්තිමත් දශක කණ්ඩායමක් තැනීමට ඔවුන්ගෙන් ලැබුණු සහය, කැපවීම, ධෛර්යය මෙම කාර්යයට ද සෘජුවම බලපෑ නිසාවෙනි. එමෙන්ම මෙම සඟරාව පිළිබඳ අදහස්, යෝජනා, චෝදනා ඇත්නම් අප හට ලබාදීමට කාරුණික වන්න. එවිට වඩාත් නිවැරදි සාර්ථක නිර්මාණයක් එළිදැක්වීමට හැකිවනු නොඅනුමානය.

**ධනංජ ශමින්ද ඇල්විටිගල** - සංස්කාරක - පෙරමග දශක කණ්ඩායම

### පෙරමග සඟරා කමිටුව





ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති, ගරු,

## විදුහල්පතිතුමාගෙන්

වචනයක්...

පෙරමග දශක කණ්ඩායම වසර ගණනාවක් මුළුල්ලේ විද්‍යාලයේ උන්නතිය උදෙසා සිය මෙහෙවර ඉටු කරන කැපී පෙනෙන දශක කණ්ඩායමකි. මෙම වසරේ සිට වාර්ෂිකව පුවත් සඟරාවක් එළි දැක්වීමට පෙරමග දශක කණ්ඩායම ඇරඹුමක් ගැනීම "පෙරමග" නාමය තව තවත් තහවුරු කිරීමට ඔවුන්ට ඇති හැකියාව පිළිබඳ කදිම නිදසුනක් ලෙස මම දකිමි. අද සමාජය හුදෙක් දැනුම සහ තොරතුරු මත පදනම් වූ සමාජයකි. එවන් වූ සමාජයක සාමාජික සාමාජිකාවන්ට දැනගත යුතු තොරතුරු විධිමත් ආකාරයෙන් එම සාමාජිකයන්ට සඟරාවක් ආශ්‍රයෙන් ලබාදීම පැසසිය යුත්තකි. එසේම වාර්ෂික සඟරාවක් මුද්‍රණය කර බෙදාදීම පහසු කටයුත්තක් නොවන අතර ඒ සඳහා විශාල කැපකිරීමක් සිදුකළ යුතු වේ. බාධා සියල්ලම මැඩ ගෙන සාමාජිකයන්ගේ දැනුමට යමක් එකතු කරනු වස් සම්පාදනය කෙරෙන පෙරමග පුවත් සඟරාවට මාගේ හද පිරි සුභාශිංෂන එකතු කරන අතර අඛණ්ඩව මෙම ප්‍රයත්නය සිදුකරගෙන යාම උදෙසා ආශිර්වාද කරමි.

**ඔෂාර පණ්ඩිතරත්න**
විදුහල්පති



ආදි ශිෂ්‍ය සංගමයේ ගරු,

## විධායක සභාපතිතුමාගේ

සුභාසිංශන...

ආදි ශිෂ්‍ය සංගමයේ, පෙරමග දශක කණ්ඩායම විසින් සම්පාදනය කරනු ලබන 'පෙරමග පුවත් සඟරාව'ට පෙරවදනක් සපයන්නේ ඉතාමත් සතුටිනි. දැඩි කැපවීමෙන් යුතුව ආදි ශිෂ්‍ය සංගමය තුළ මෙන් ම පාසල තුළද ක්‍රියාකාරීව කටයුතු කරන ආදි ශිෂ්‍ය සහෝදර සහෝදරියන්ගෙන් සැදුම් ලත් 2001-2010 පෙරමග දශක කණ්ඩායම විසින් ප්‍රකාශයට පත් කරන මෙම සඟරාව වත්මන් සමාජයට දැනුම සහ තොරතුරු විධිමත් ආකාරයෙන් ලබාදීමට ගත් මෙම උත්සාහය පැසසිය යුතු ය.

වාර්ෂිකව මුද්‍රණය කළ ද, සඟරාවක් සකස් කරගැනීම පහසු කාර්යයක් නොවන අතර ඒ සඳහා කණ්ඩායමේ සාමාජිකයින්ගේ කැපවීම මෙන්ම උනන්දුව බෙහෙවින් අවශ්‍ය වේ. ඒ සියල්ල මනාව කැටිකොට 'පෙරමග' නාමය රන් සලකුණක් ලෙස වඩ වඩාත් ඉදිරියට ගෙන යාමට හැකිවේවායි සුභ ප්‍රාර්ථනා කරමි.

**ගනේෂ් අබේසේකර**
විධායක සභාපති (2018/2019)



ආදි ශිෂ්‍ය සංගමයේ ගරු,

## ප්‍රධාන ලේකම්තුමාගේ

සුභාසිංශන...

ආදි ශිෂ්‍ය සංගමයේ 2001-2010 වර්ෂ නියෝජනය කරනු ලබන පෙරමග දශක කණ්ඩායම සිය 12 වන සංවත්සරයට සමගාමීව ආරම්භ කරනු ලබන 'පෙරමග පුවත් සඟරාව' කුළුදුල් ප්‍රකාශනය වෙනුවෙන් ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් ලෙස සුභාශිංසන එකතු කරනුයේ ඉමහත් සතුටිනි.


මා පසුගිය දශක තුනකට වැඩි කාලයක සිට ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරීව කටයුතු කරන හෙයින්ද, ආදි ශිෂ්‍ය සංගමයේ පළමු දශක කණ්ඩායම ලෙස බිහි වූ අරලිය කණ්ඩායමේ ලේකම් ලෙස කටයුතු කර ඇති බැවින් ද, දශක කණ්ඩායමක ක්‍රියාකාරීත්වය පිළිබඳව මෙන්ම එහි වැදගත්කම පිළිබඳව හොඳ අවබෝධයක් ඇත. විශේෂයෙන්ම පෙරමග දශක කණ්ඩායම එහි ආරම්භයේ සිටම දක්වන ලද ක්‍රියාකාරීත්වය සහ පාසලට සිදු කරන ලද සේවය පිළිබඳව ඉතා සතුටු වෙමි. පසුගිය වසර කිහිපය තුළ වැඩි ම ක්‍රියාකාරී දශක කණ්ඩායම වන පෙරමග විසින් ආරම්භ කරනු ලබන පෙරමග පුවත් සඟරාව තුළින් ප්‍රධාන ආදි ශිෂ්‍ය සංගමයේ කටයුතු මෙන්ම අනෙකුත් දශක කණ්ඩායම්වලටත් පාසලේ ක්‍රියාකාරකම් පිළිබඳවත් ආදි සිසුන් වර්තමාන සිසු දරු දැරියන් මෙන් ම සමාජය දැනුවත් කිරීමටත් ඉමහත් පිටිවහලක් වෙනු ඇත.


පෙරමග දශක කණ්ඩායම විසින් එළිදක්වනු ලබන කුළුදුල් නිර්මාණය, 'පෙරමග පුවත් සඟරාව' දියුණුවෙන් දියුණුවට පත් වේවායි හෘදයාංගමව සුභ පතමි.

**ලලිත් ආර්. වැලිකල**
ප්‍රධාන ලේකම් (2018/2019)

## ක්‍රීඩාපිටිය සංවර්ධනය

අක්කර 4ක පමණ භූමි භාගයක ඉදිකර ඇති අප විද්‍යාලයේ ක්‍රීඩා පිටිය අන් කිසිදු පාසලක ඇති ක්‍රීඩා පිටියකට නොදෙවෙනි විශාල ක්‍රීඩා පිටියකි. එකවර ක්‍රීඩා කිහිපයක් සිදුකළ හැකි මට්ටමේ පහසුකම් වලින් සපිරි අප විද්‍යාලයීය ක්‍රීඩා පිටිය වර්තමානයේ මෙන්ම ඉදිරි සිසු පරම්පරා ගණනාවකටම සිය දක්ෂතා ඔපමට්ටම් කරගත හැකි මනා තෝතැන්නකි. තවදුරටත් මෙහි සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කෙරෙන අතර ඒ හරහා අංග සම්පූර්ණ ක්‍රීඩාංගනයක් දම්පල් දරු දැරියන්ට දායාද කෙරෙනු ඇත. ඒ සඳහා ඔබගේ සහයෝගය තවදුරටත් පාසලට ලබාදිය හැකි ය.










ප්‍රාථමික අංශයේ

## සෙල්ලම් මිදුල සංවර්ධනය

ප්‍රාථමික අංශ දරුවන්ගේ අධ්‍යාපනය මෙන්ම මානසික සංවර්ධනය සඳහා ඉමහත් පිටිවහලක් සපයන සෙල්ලම් මිදුල සංවර්ධනය මේ වනවිට සිදුවෙමින් පවතින ව්‍යාපෘතියකි. පොතපතින් ලබන දැනුම මෙන්ම කුඩා දරුවන්ට මෙම සෙල්ලම් මිදුලකින් ලබන මානසික සංවර්ධනය, කුසලතා සංවර්ධනය, අන්තර් පුද්ගල සබඳතා සංවර්ධනය යනාදිය ඔවුන්ගේ යහපත් වර්ධනයට ඉමහත් පිටිවහලකි. ඒ අනුව සෙල්ලම් මිදුල දරුවන්ට වඩා ආරක්ෂාකාරී ලෙස ක්‍රමානුකූලව ඉදිකිරීම ඉතා වැදගත් වේ. ඒ සඳහාද ඔබට දායකත්වය ලබාදිය හැකි අතර ඒ සඳහා ඔබේ දශක කණ්ඩායම හරහා අවශ්‍ය අනුග්‍රාහකත්වයන ලබාදිය හැකි ය.





# පෙරමං තැනූ සහෘද පෙරගමන්කරුවන්.....

## 2007-2008


සභාපති **ගයාන් රුක්ෂාන්**


ලේකම් **සනත් ලසන්ත**

**උප සභාපති**
පුබුදු ගුණවර්ධන

**උප ලේකම්**
තරංග දර්ශන

**භාණ්ඩාගාරික**
කල්හාර කරුණාරත්න

**උප භාණ්ඩාගාරික**
චාමිකා ජයමාන්න

**සංවිධායක**
නිසල් ගුරුගේ

**උප සංවිධායක**
තාරක දුෂ්මන්ත

**සංස්කාරක**
දිනිති විමුක්ති

**කාරක සභික**
චරිත් ඉන්දික
මෙනකා සමරන්ති
රනුෂිකා චරන්ගි
අනුරාධ නිෂාද්
දුමින්ද සේනාරත්න
සමීර රාජපක්ෂ
රුවනි වත්සලා
චින්තක ලංකා
හසිත් බුද්ධික
මිහිදු පනංගල
ඉසුරි ලියනගේ

## 2008-2009


සභාපති **තාරක දුෂාන්ත**


ලේකම් **ගයනි කෞෂල්‍යා**

**උප සභාපති**
ලහිරු ජයසුන්දර

**උප ලේකම්**
නෙලුම් අමරබන්දු

**භාණ්ඩාගාරික**
චාමිකා ජයමාන්න

**උප භාණ්ඩාගාරික**
වසන්ත වීරතුංග

**සංවිධායක**
චමිල ජයසිංහ

**උප සංවිධායක**
තරංග මිහිරාජ්

**සංස්කාරක**
චතුරංගි රසිකලා

**හිටපු සභාපති**
ගයාන් රුක්ෂාන්

**කාරක සභික**
වෙනුර කසුන්සිරි
ශමින් අමිල
විජේනායක
ප්‍රියන්කා දිල්හානි
ධනුෂ්ක ඩයස්
රංගිලා දෙහිගහවත්ත
ප්‍රගීත් රුක්ෂාන්
ජයම්පති ජයවර්ධන
හසන බුද්ධික
කසුන් ශානක
සුචිත්‍රා දේශානි
චමිදු නුවන්

## 2009-2010


සභාපති **තරංග දර්ශක**


ලේකම් **ජීවන් ප්‍රියදර්ශන**

**උප සභාපති**
චමිල ජයසිංහ

**උප ලේකම්**
පුබුදු ගුණවර්ධන

**භාණ්ඩාගාරික**
භාෂක ගුණතිලක

**උප භාණ්ඩාගාරික**
කල්හාර කරුණාරත්න

**සංවිධායක**
නිසල් ගුරුගේ

**උප සංවිධායක**
චතුර හෙට්ටිආරච්චි

**සංස්කාරක**
රංගිලා දෙහිගහවත්ත

**හිටපු සභාපති**
තාරක දුෂාන්ත

**කාරක සභික**
වෙනුර කසුන්සිරි
චාමිකා ජයමාන්න
නයෝමාල් ඉඹුලාන
නදීකා මදුෂානි
මිහිදු පනංගල
චිරංග ගුණසේකර
නලින් පෙරේරා
විපුල පුලස්ති
තනුර ද සිල්වා
ගයාන් කුරුප්පු
ක්‍රිෂාන්ති නිලූෂා

## 2010-2011


සභාපති **චමිල ජයසිංහ**


ලේකම් **සනත් ලසන්ත**

**උප සභාපති**
තාරක දුෂාන්ත

**උප ලේකම්**
චතුර හෙට්ටිආරච්චි

**භාණ්ඩාගාරික**
කල්හාර කරුණාරත්න

**උප භාණ්ඩාගාරික**
යශෝධා සුරිආරච්චි

**සංවිධායක**
ගයාන් රුක්ෂාන්

**උප සංවිධායක**
රුවින්ද මාරසිංහ

**සංස්කාරක**
නිසල් ගුරුගේ

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
ජීවන් ප්‍රියදර්ශන
පුබුදු ගුණවර්ධන

**හිටපු සභාපති**
තරංග දර්ශන

**කාරක සභික**
වෙනුර කසුන්සිරි
සුරංග සමීර
සමීරා කෞමදී
රසිකා ප්‍රියදර්ශනි
සංජීවනි සිල්වා
රුවනි වත්සලා
ඩිලාන් තිසේරා
නිමිනි අත්තනායක
ලුමින්ද දාබරේ
යසිරු චතුරංග
නිෂාදි රුක්ෂානි

## 2011-2012


සභාපති **වෙනුර කසුන්සිරි**


ලේකම් **ශමේන්ද්‍ර ධර්මසේන**

**උප සභාපති**
මිහිදු පනංගල

**උප ලේකම්**
අරුණි රශ්මිකා

**භාණ්ඩාගාරික**
රුවින්ද මාරසිංහ

**උප භාණ්ඩාගාරික**
සමීරා කෞමදී

**සංවිධායක**
ලුමින්ද දාබරේ

**උප සංවිධායක**
පූර්නිමා රංගනි

**සංස්කාරක**
නිසල් ගුරුගේ

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
ජීවන් ප්‍රියදර්ශන
පුබුදු ගුණවර්ධන

**හිටපු සභාපති**
චමිල ජයසිංහ

**කාරක සභික**
තනුජා ප්‍රියදර්ශනි
දුල්මිනි ඉමාෂා
දිල්හාන් ජයතිලක
සංජීවනි සිල්වා
රුවනි වත්සලා
සංජීව කුමාර
නිෂාදි රුක්ෂානි
ශ්‍රී නුවන් කොඩිකාර
පෙවින්ද බැලගම
වාසනා වින්ධ්‍යා

## 2012-2013


සභාපති **ජීවන් ප්‍රියදර්ශන**


ලේකම් **පූර්නිමා රංගනි**

**උප සභාපති**
තාරක දුෂාන්ත

**උප ලේකම්**
සමීරා කෞමදී

**භාණ්ඩාගාරික**
චරිත් ලියනගේ

**උප භාණ්ඩාගාරික**
ලසන්ති රනවක

**සංවිධායක**
රුවින්ද මාරසිංහ

**උප සංවිධායක**
ශමේන්ද්‍ර ධර්මසේන

**සංස්කාරක**
නිසල් ගුරුගේ

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
නයෝමාල් ඉඹුලාන

**හිටපු සභාපති**
වෙනුර කසුන්සිරි

**කාරක සභික**
චමිල ජයසිංහ
පුබුදු ගුණවර්ධන
චතුර හසන්ත
චාමිකා ජයමාන්න
අමිල ඉරෝෂන
තරංග දර්ශන
සනත් ලසන්ත
සමන් සුජීව
ඉෂාරා ඇලෙක්සැන්ඩ්‍රා
රුවනි වත්සලා
චාමර අත්තනායක
මලින්ද වීරක්කොඩි
යසන්ත ගමගේ
තරිඳු ධනුෂ්ක
වාසනා වින්ධ්‍යා
ඉෂන්කා කොඩිතුවක්කු
තනුජා ප්‍රියදර්ශනි
අරුණි රශ්මිකා
සංජීව කුමාර

# පෙරමං සලකුණු

දම්පල් විදු මැණියන්ගේ අභිවෘද්ධිය පිණිස පෙරමග තුළින් ලබාදුන් දායකත්වය අති මහත්ය. පෙරමග ආරම්භ වූ 2007 වසරේ සිට විද්‍යාලයේ ආදිශිෂ්‍ය සංගමය තුළ ඉතා ක්‍රියාකාරී කණ්ඩායමක් ලෙස පෙරමගෙන් සිදුකරන ලද මෙහෙවර පිළිබඳ අවලෝකනයකි මේ...

### ■ 2007-2008 වර්ෂය

අභිමානවත් පෙරමග දශක කණ්ඩායමේ ආරම්භය සිදුවූයේ 2007 මැයි 15 දිනයි. එහි මුල්ම පෙරගමන්කරුවා ලෙස ගයාන් රුක්ෂාන් මහතාගේ නම සටහන් වේ. සාමාජිකයන් 20කින් පමණ ආරම්භ වූ පෙරමග කණ්ඩායම ආරම්භක වසර තුළදීම සාමාජිකයන් 170කගේ පමණ සහභාගීත්වයෙන් මංගල මහා සභාව පවත්වන ලදී. පෙරමග නම හා ලාංඡනය සකස් වූයේ ද මෙම වසර තුළදීම ය. ආදිශිෂ්‍ය



සංගමය තුළ වඩාත් ක්‍රියාකාරී දශක කණ්ඩායමක් ලෙස බබලන 'පෙරමග' නාමයෙහි නිර්මාතෘවරයා වන්නේ අප විද්‍යාලයෙහි නියෝජ්‍ය විදුහල්පති පූජ්‍ය රේටියගම ඤාණිස්සර ස්වාමීන් වහන්සේ වන අතර, ලාංඡනය නිමවන ලද්දේ ආරම්භක සභාපති ගයාන් රුක්ෂාන් මහතා සහ නිසල් බී. ගුරුගේ මහතාය. එමෙන්ම අදටත් සාර්ථකව පැවැත්වෙන ආදි සිසුන්ගේ සය සාමාජික ක්‍රිකට් තරගාවලිය ආරම්භ වූයේ ද මේ මංගල වසර තුළ දී ම ය. එයට අමතරව රුක් රෝපණ වැඩසටහනක් හා ධර්ම දේශනා වැඩසටහනක් ද සංවිධානය කිරීමට මේ කණ්ඩායමට හැකිවිය.

### ■ 2008-2009 වර්ෂය

තාරක දුෂාන්ත මහතා නායකත්වය හෙබවූ පෙරමගේ දෙවන වසර ද සාර්ථක වසරක් ම විය. සාම්ප්‍රදායික ශාන්තිකර්ම ඇසුරින් ඉදිරිපත් කළ "දම්පල් පාලිය" නම් ප්‍රසංගය නැරඹූවන්ට අදටත් අමතක නොවන අත්දැකීමකි. peramaga.org නමින් පෙරමග වෙබ් අඩවිය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම ද මෙසමයෙහි සිදුවූ අතර එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූයේ හිටපු නියෝජ්‍ය පොලිස්පති ලලිත් ගුණසේකර මහතායි. මීට අමතරව පෙරමග සුහද හමුව හා සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කිරීමත්, විද්‍යාලයේ උසස් පෙළ






සිසුන් සඳහා විභාග සම්මන්ත්‍රණ සංවිධානය කිරීමත් මෙම වසර තුළ පෙරමගෙන් සිදුකරනු ලැබූ අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ.

### ■ 2009-2010 වර්ෂය

පසුගිය වසර වලදී මෙන්ම දම්පල් පාලිය ශාන්තිකර්මයද, සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියද සමගින් පාසලේ අනෙකුත් සංවර්ධන කටයුතු වලට ක්‍රියාකාරී සහභාගීත්වයක් ලබාදුන් වර්ෂයක් ලෙස තරංග දර්ශක සොයුරාගේ සභාපතීත්වයෙන්

# පෙරමග දශක කණ්ඩායම ආරම්භයේ සිට පෙරට තනන්නට වෙහෙස වූ, පෙරමග මෙනුමෙන් පෙරමග තැනුමන්ට හැඳිරි ස්තුතිය..!

## 2013-2014


සභාපති
**සනත් ලසන්ත**


ලේකම්
**අරුණි රශ්මිකා**

**උප සභාපති**
සුරංග සමීර

**උප ලේකම්**
ශමේන්ද්‍ර ධර්මසේන

**භාණ්ඩාගාරික**
සමීරා කෞමදී

**උප භාණ්ඩාගාරික**
අමිල ඉරෝෂන

**සංවිධායක**
යසන්ත ගමගේ

**උප සංවිධායක**
වර්ණ රංග

**සංස්කාරක**
නිසල් ගුරුගේ

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
නයෝමාල් ඉඹුලාන

**හිටපු සභාපති**
ජීවන් ප්‍රියදර්ශන

**කාරක සභික**
තාරක දුෂාන්ත
ජනිත් පියුමාල්
චතුර හසන්ත
රන්ජන් ලක්මාල්
රසික රණසිංහ
ඉරේෂා මධුවන්ති
වරුණ විජේසේකර
රුවනි වත්සලා
ක්‍රිශානි සමරවීර
උපුල් වැලිකල
චමිදු නුවන්
සචිත්‍රා ගෝවින්දි
සංජීව කුමාර
නිශාදි රුක්ෂානි
තරිඳු ධනුෂ්ක
සාරංග පීරිස්
තනූජා ප්‍රියදර්ශනි
ඉෂන්කා
කොඩිතුවක්කු
ලසන්ති රනවක
රුවින්ද මාරසිංහ
පූර්ණිමා පතිරගේ
තරංගා සේනාරත්න

## 2014-2015


සභාපති
**රසික රණසිංහ**


ලේකම්
**රනුෂිකා එරංගි**

**උප සභාපති**
රනිල් සම්පත්

**උප ලේකම්**
අප්සරා මදුවන්ති

**භාණ්ඩාගාරික**
නෙලුක තරංග

**උප භාණ්ඩාගාරික**
සුරන්ති රත්නායක

**සංවිධායක**
සාරංග පීරිස්

**උප සංවිධායක**
වර්ණ රංග

**සංස්කාරක**
රන්ජන් ලක්මාල්

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
චමල් පවිත්‍ර

**හිටපු සභාපති**
සනත් ලසන්ත

**කාරක සභික**
රුවන්ති අනුරාධා
සුරංග සමීර
චානක රත්නායක
දුමින්ද සේනාරත්න
ප්‍රගීත් රුක්ෂාන්
රුවනි වත්සලා
දුලාන් දර්ශන
ලෙෂාන්ති පෙරේරා
සචිත්‍රා ගොවින්දි
ඉරේෂා මධුවන්ති
තනුර ද සිල්වා
තරිඳු පෙරේරා
දිනේෂා නදීෂානි
ලක්මිණි මදුවන්ති
මොවිනි පෙරේරා
රුවින්ද මාරසිංහ
අරුණි රශ්මිකා
වෙනුර කසුන්සිරි
නිශාදි රුක්ෂානි
ශමේන්ද්‍ර ධර්මසේන

## 2014-2015


සභාපති
**රුවින්ද මාරසිංහ**


ලේකම්
**නිශාදි රුක්ෂානි**

**උප සභාපති**
දුලාන් දර්ශන

**උප ලේකම්**
නෙලුක තරංග

**භාණ්ඩාගාරික**
සාරංග පීරිස්

**උප භාණ්ඩාගාරික**
මොවිනි පෙරේරා

**සංවිධායක**
රනිල් සම්පත්

**උප සංවිධායක**
චානක රත්නායක

**සංස්කාරක**
නිසල් ගුරුගේ

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
තරංගා සේනාරත්න

**හිටපු සභාපති**
රසික රණසිංහ

**කාරක සභික**
පුබුදු ගුණවර්ධන
අසංක ජයනාත්
රනුෂිකා එරන්ගි
අප්සරා මධුවන්ති
හර්ෂ සංජය
සමුද්‍රිකා ගයත්‍රි
ලක්මාල් වීරතුංග
උදේෂිකා ලියනගේ
දිලීප තුෂාර
උෂානි ගයත්‍රි
නිසාන් සාලින්ද
සචිත්‍රා ගොවින්දි
යසන්ත ඉන්දීවර
තමිදු සන්තාරක
සමීර මාරසිංහ
නුවන්තිකා මදුශානි
රුවන්ති විද්‍යානි
සනත් ලසන්ත
වසන්ත වීරතුංග

## 2015-2016


සභාපති
**රසික මධුසංක**


ලේකම්
**නුරාගි බණ්ඩාර**

**උප සභාපති**
ලක්මාල් වීරතුංග

**උප ලේකම්**
ඉරේෂා මධුවන්ති

**භාණ්ඩාගාරික**
දිලීප තුෂාර

**උප භාණ්ඩාගාරික**
දිමුතු කුමාර

**සංවිධායක**
දුලාන් දර්ශන

**උප සංවිධායක**
හිලිණි ඉෂාරා

**සංස්කාරක**
රුවනි වත්සලා

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
තරංගා සේනාරත්න

**හිටපු සභාපති**
රුවින්ද මාරසිංහ

**කාරක සභික**
වසන්ති පෙරේරා
දිල්හානි ධර්මරත්න
පුබුදු ගුණවර්ධන
චරිත් පෙරේරා
සමන්තිකා බාලසූරිය
ඕෂධී වසුන්දරා
දිමුතු රංගනී
දිශේකා දිසානායක
සුලක්ෂණ විදුරංග
ශාලික රන්වල
වත්සල ගොඩකුඹුර
ජානකී පෙරේරා
ගයනී වත්සලා
නිශාදි රුක්ෂානි
රුසිරු වගීෂ බැලගම
චාමරි රාජිකා
චන්දිම මද්දුගොඩ
පියුමි දිසානායක
ශානිකා සාරංගී
නුවන්තිකා මධුශානි
බුද්ධික රොෂාන්

## 2016-2017


සභාපති
**සමීර හේෂාන්**
(2017 Mar. - 2017 Nov.)


සභාපති
**පුබුදු ගුණවර්ධන**
(2017 Nov. - 2018 Feb.)


ලේකම්
**ඉරේෂා මධුවන්ති**

**උප සභාපති**
පුබුදු ගුණවර්ධන
(2017 Mar. - 2017 Nov.)

**උප ලේකම්**
නිශාදි රුක්ෂානි

**භාණ්ඩාගාරික**
දිමුතු කුමාර

**උප භාණ්ඩාගාරික**
චරිත පෙරේරා

**සංවිධායක**
රුවින්ද මාරසිංහ

**උප සංවිධායක**
නුරාගි බණ්ඩාර

**සංස්කාරක**
රුවනි වත්සලා

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
සනත් ලසන්ත

**හිටපු සභාපති**
රසික මධුසංක

**කාරක සභික**
බුද්ධික අමරසිංහ
චමරි අනුරුද්ධිකා
නෙලුක තරංග
රන්ජන් ලක්මාල්
දිමුතු රංගිකා
වරුණ විජේසේකර
ජීවන් ප්‍රියදර්ශන
ශෂිනි මුදුන්කොටුව
ගයනි වත්සලා
දුලාන් දර්ශන
ජානකී පෙරේරා
අන්ජලිකා ලක්මාලි
සුලක්ෂණ විදුරංග
යශෝධා ශ්‍යාමලී
අරුණි රශ්මිකා
පෙවින්ද බැලගම
චන්දිම මද්දුගොඩ
නුවන්තිකා මධුශානි
රුසිරු වගීෂ බැලගම
ගයානි කොස්වත්තගේ

## 2017-2018


සභාපති
**රුසිරු බැලගම**


ලේකම්
**වෙනුර කසුන්සිරි**

**උප සභාපති**
ගයාන් රුක්ෂාන්

**උප ලේකම්**
නිශාදි රුක්ෂානි

**භාණ්ඩාගාරික**
චමිල දසනායක

**උප භාණ්ඩාගාරික**
සුලක්ෂණ විදුරංග

**සංවිධායක**
නෙලුක තරංග

**උප සංවිධායක**
චමිදු මදුශංක

**සංස්කාරක**
බුද්ධික රොෂාන්


**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**
සනත් ලසන්ත

**හිටපු සභාපති**
පුබුදු ගුණවර්ධන

**කාරක සභික**
බුද්ධික පෙරේරා
චාමිකා ජයමාන්න
රනුෂිකා එරන්ගි
රනිල් සම්පත්
කේ.පී.යු රංගන
දිලිනි ලාංකිකා
චාමලි නිසංසලා
ගයනි විජේකෝන්
ලක්මාල් වීරතුංග
හිවන්ත කොස්වත්තගේ
ධනංජ ඇල්විටිගල
අන්ජලිකා ලක්මාලි
ඉරේෂා මධුවන්ති
කල්පිත කෝදාමුල්ල
උපේක ජයවර්ධන
ගයනි කොස්වත්තගේ
දිනේෂා නදීෂානි
කසුන් මධුශංක
ශානිකා සාරංගී
හිහාන් චතුරංග
සාරංග පීරිස්
රෝෂන් මදුශංක

✍ චරිතා සෙනෙවිරත්න

යුත් මෙම වසර හැඳින්විය හැකිය.




## ■ 2010-2011 වර්ෂය

විද්‍යාලයේ වටිනාකම තවත් ඉහළ නංවමින් ඉදිකෙරුණු පිහිනුම් තටාකය සඳහා මුදල් පරිත්‍යාග කරමින් පෙරමගේ දායකත්වය ලබාදීමට කටයුතු කළේ 2010 - 2011 වකවානුව තුළ ය. පෙර වසර වලදී මෙන්ම ධර්ම දේශනා මාලාවක්, රුක් රෝපණ වැඩසටහනක් හා සය සාමාජික ක්‍රිකට් තරගාවලියක් ද පැවැත්වීමට මේ වසර තුළදී ද හැකිවිය. එයට නායකත්වය සැපයුවේ චමිල ජයසිංහ මහතායි.

## ■ 2011-2012 වර්ෂය

2011 - 2012 වසර තුළ ද වෙනුර කසුන්සිරි මහතාගේ නායකත්වයෙන් අප කණ්ඩායම මගින් සේවාවන් රැසක් ඉටු කරන ලදී. පාසල




තුළ ස්ථාන රැසක අදටත් දැකිය හැකි අභිප්‍රේරණ වැකි සහිත පුවරු සවිකිරීමත් පාසල් සිසුන් හා ආදි සිසුන් සඳහා ධර්ම දේශනා වැඩසටහන් පැවැත්වීමත් ඒ අතර ප්‍රධාන වේ. ඊට අමතරව ආදි සිසුන්ගේ සහෝදරත්වය වර්ධනය කරන අටියෙන් සංවිධානය කළ සය සාමාජික ක්‍රිකට් තරගාවලිය හා වාර්ෂික සුහද හමුව ද මෙම වසරේදීත් සාර්ථකව පැවැත්විණි.

## ■ 2012-2013 වර්ෂය

මෙම වසර පෙරමගේ සැමට විශේෂිත මතකයන් රැසක් එක්කළ වසරක් ලෙස සඳහන් කළ හැක. ජීවන් ප්‍රියදර්ශන මහතාගේ




නායකත්වය හා මගපෙන්වීම යටතේ පෙරමග දශක කණ්ඩායමෙහි පළමු ගෘහස්ත සංගීත ප්‍රසංගය වන Marians Unplugged සංගීත ප්‍රසංගය අති උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණේ 2012 - 2013 වසර තුළයි. එයින් උපයාගත් ආදායමෙන් කොටසක් විද්‍යාලයීය බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය ඉදිකිරීම වෙනුවෙන් පරිත්‍යාග කෙරුණේ දම්පල් විදුමවින් කෙරෙහි සිය යුතුකම් ඉටුකරන අටියෙනි. එපමණක් නොව කණ්ඩායමෙහි සුහදතාව වර්ධනය කරනු වස් සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය හා පෙරමග සුහද හමුව ද සංවිධානය කෙරිණි. එයින් ද නොනැවතී විද්‍යාලයේ උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සිසුන් සඳහා සම්මන්ත්‍රණ සංවිධානය කිරීමෙනුත්, ළමා හා කාන්තා කාර්යාංශයේ හා සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ සහය ඇතිව ළමා අපචාර මැඩලීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීමෙනුත් පෙරමග දශක කණ්ඩායමේ නොනිමි මෙහෙවර තවත් පුළුල්ව ඉදිරියට ගෙනයන ලදී.

06 වෙනි පිට බලන්න...

05 වෙනි පිටුවෙන්...

## ■ 2013-2014 වර්ෂය

සනත් ලසන්ත මහතා සභාපතිත්වය හෙබවූ 2013 - 2014 වර්ෂය ද පෙරමගට සුවිශේෂී වසරක් වූ බව කිව හැකිය. සිය ප්‍රධාන මූලෝත්පාදන ව්‍යාපෘතිය ලෙස Marians Jothi & Clarence ප්‍රසංගය සාර්ථකව පැවැත්වූ අතර ඒ හරහා විද්‍යාලයීය බැඩ්මින්ටන් ක්‍රීඩාපිටිය ආලෝකකරණය සඳහා මුදල් ලබාදීමට පෙරමගට හැකි විය. ධර්ම දේශනා මාලාව, සය සාමාජික ක්‍රිකට්




තරගාවලිය, රුක්රෝපණ වැඩසටහන හා සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සිසුන් සඳහා සම්මන්ත්‍රණ මාලාව මේ වසරේ දී ද පැවැත්විණි. එමෙන්ම සුරංග සමීර මහතාගේ මැදිහත් වීමෙන්, සිල් සමාදන් වූ පිරිස් සඳහා බෞද්ධ පුවත්පත් විශාල ප්‍රමාණයක් බෙදා දීමට ද කටයුතු කෙරිණි. එපමණකින් නොනැවතී දම්පල් ඇදුරු උයන හා ආදි සිසු සෙවණේ භූමි අලංකරණය ද පෙරමගේ දායකත්වයෙන් සිදුවිය. ආදිශිෂ්‍ය සංගම් කාර්යාලයේ නඩත්තු කටයුතු යනාදියත් පෙරමග දශක කණ්ඩායම විසින් සිදුකරන ලදී. මෙම වසර තුළදී සිදුවූ තවත් වැදගත් කාර්යයක් වන්නේ පෙරමග සාමාජිකත්ව නාම ලේඛණයක් සැකසීම ආරම්භ කිරීමයි.

## ■ 2014-2015 වර්ෂය

2014-2015 වසර සඳහා පෙරමග නායකත්වයට පත්වූයේ රසික රණසිංහ මහතායි. එම වර්ෂයේ ද ප්‍රධාන




මූලෝත්පාදන ව්‍යාපෘතිය වූයේ මේරියන්ස් සංගීත ප්‍රසංගයයි. එම ව්‍යාපෘතියෙන් රුපියල් මිලියනයක මුදලක් විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සංවර්ධන කටුයතු සඳහා පරිත්‍යාග කෙරිණි. පෙර වසර වලදී මෙන්ම





මේ වසරේ ද සය සාමාජික ක්‍රිකට් කරගාවලිය උත්කර්ෂවත්ව පැවැත්වීමට පෙරමගට හැකි විය. එමෙන්ම කඹරව කණිෂ්ඨ විද්‍යාලයට පාසල් උපකරණ බෙදාදීම සහ මියගිය ආදී ධර්මපාලීයයන් සිහිකර දානමය පිංකමක් පැවැත්වීමද මේ වසරේදී සිදු විය. තවද සිල් සමාදන් වූ පිරිස් අතරේ මහාමේඝ බෞද්ධ පුවත්පත බෙදා දීමට ද කටයුතු කෙරිණි.

## ■ 2015-2016 වර්ෂය

රුවින්ද මාරසිංහ මහතා සමග පෙරමගටම ගිය අප කණ්ඩායම 2015-2016 වසරේදී විදුහලට නොමඳ දායකත්වයක් දැක්වූ බව කීම අතිශයෝක්තියක් නොවේ. සිය ප්‍රධාන ව්‍යාපෘතිය ලෙස විද්‍යාලයීය ගණිතාගාරයේ මූලික අඩියරයන් සඳහා දායක වූ පෙරමග,




විද්‍යාලයීය 75 වන සංවත්සර සැණකෙළියෙහි විනෝද ක්‍රීඩා අංශය ද සාර්ථකව මෙහෙයවීය. සය සාමාජික ක්‍රිකට් තරගාවලියක් ද පැවැත්වුණු මේ වර්ෂයෙහි ප්‍රධාන මූලෝත්පාදන ව්‍යාපෘතිය වූයේ ඉතා ජනප්‍රිය වූ Marians Unplugged with Athma ප්‍රසංගයයි.

## ■ 2016-2017 වර්ෂය

මෙම වසර ද පෙරමගට තවත් සොඳුරු මතකයන් රැසක් එකතු කළ වසරකි. මෙකල පෙරමග පෙරටුගාමියා වූ රසික මධුසංඛ මහතාගේ මූලිකත්වයෙන් එම වසරේ ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස CT Show by Marians ප්‍රසංගය පැවැත්විනි. මෙම වර්ෂයේදී ද සය සාමාජික ක්‍රිකට් තරගාවලිය සාර්ථකව සංවිධානය කර තිබූ අතර ඇහැලියගොඩ







ප්‍රදේශයේ පාසලකට ගංවතුර ආධාර ලබාදීම ද පෙරමගේ මූලිකත්වයෙන් සිදු කෙරිණි.

## ■ 2017-2018 වර්ෂය

පෙරමග දශක කණ්ඩායමට දස වසරක් සපිරුණු මෙම වසර තුළ නායකත්වය හෙබවූයේ සමීර හේෂාන් සහ පුබුදු ගුණවර්ධන යන මහත්වරුන් දෙපළයි. ප්‍රධාන මූලෝත්පාදන ව්‍යාපෘතිය වූ "අපි කවුරුද" වායෝ ප්‍රසංගය සැමටම අමතක නොවන අත්දැකීමක් විය. එම වසර තුළ පැවැත්වූ සුහද හමුව, සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය හා දස වැනි සංවත්සර සැමරුම යන අංග තුළින් කණ්ඩායමේ සුහදත්වය වර්ධනය කරගැනීමට හැකිවිය. තවද ගංවතුරෙන් හානියට පත්වූ පාසල් කිහිපයකට සහනාධාර ලබාදීම මෙම වසර තුළ සිදුවූ තවත් එක් සුවිශේෂ සේවාවකි.






## ■ 2018-2019 වර්ෂය


රුසිරු බැලගම මහතාගේ නායකත්වයෙන් පෙරමග බලා ගිය පෙරමග දශක කණ්ඩායමේ මෙම වසරේ ප්‍රධාන මුල්‍ය උත්පාදන ව්‍යාපෘතිය වූයේ ARCH Coloured by Daddy ප්‍රසංගය වූ අතර ඉන් වාර්ථාගත ආදායමක් ඉපැයීමට හැකිවිය. ඒ හරහා විද්‍යාලයේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරනු වස් රුපියල් මිලියන 4ක පමණ වියදමකින් සියලු පහසුකම් වලින් සමන්විත වැසිකිළි පද්ධතියක් විද්‍යාලයේ 6-9 ශ්‍රේණී සඳහා දායාද කරන ලදී. මෙය පෙරමග දශක කණ්ඩායම විසින් මෙතෙක් සිදුකළ විශාලතම ව්‍යාපෘතිය මෙන්ම ආදිශිෂ්‍ය දශක කණ්ඩායමක් විසින් සිදුකළ දෙවන විශාලතම ව්‍යාපෘතිය ද වේ. මීට අමතරව පාසලේ භාවිතයට නොගෙන ඉවත්කර තිබූ ඩෙස් පුටු විශාල ප්‍රමාණයක් අලුත්වැඩියා කර පාසලට භාරදීම හා දකුණු කොළඹ ශික්ෂණ රෝහලට එක්ස්රේ බහාලුම් පරිත්‍යාග කිරීම එම වර්ෂය තුළදී සිදුකරන ලද තවත් විශේෂ කාර්යයන් වේ.

යමු යමු පෙරමග බලා... සිය නොනිමි මෙහෙවර ඉදිරියට ගෙන යාමට බුද්ධික රොෂාන් සොයුරාගේ මගපෙන්වීමෙන් පෙරටම යන පෙරමග දශක කණ්ඩායම මේ වසරේදී ද පාසලේ හා සංගමයේ සුබසිද්ධිය උදෙසා වැඩ කටයුතු රැසක් සැලසුම්කර තිබේ. මෙම පුවත් සඟරාව එළිදැක්වීමට අමතරව මෙම වසරේදී ද සය සාමාජික ක්‍රිකට් තරගයක් සංවිධානය කෙරෙනුයේ ආදි සිසුන් අතර සුහදතාව හා සහෝදරත්වය වර්ධනය කිරීමේ අරමුණෙනි. අප්‍රේල් මාසයේ පැවැත්වූ ධර්මපාල - රාහුල මහා ක්‍රිකට් තරගාවලියට ද පෙරමගේ නොමඳ දායකත්වය හිමිවිය. එමෙන්ම ප්‍රධාන මූලෝත්පාදන ව්‍යාපෘතිය ලෙස ඉදිරියේදී පැවැත්වීමට නියමිත වායෝ සංගීත කණ්ඩායමේ 'අනාගතයේ' සංගීත සැඳෑවද සැමටම නවමු අත්දැකීමක් ගෙනදෙනු නොඅනුමානය.

ඉහත තොරතුරු ලබාගැනීමට සහය දුන්, පසුගිය වර්ෂ වල හිටපු සභාපතිවරුන්, ලේකම්වරුන් ඇතුළු සියලු දෙනාට විශේෂයෙන් ස්තූතිවන්ත වෙමු.

✍ සංජය ද සිල්වා









## 2019 රන් සිංහයන්ගේ එක් දින සටනින්

# ධර්මපාල කණ්ඩායමට ජය







සිව් වන වරටත් පැවැත්වූ රන් සිංහයන්ගේ එක්දින ක්‍රිකට් තරඟාවලියේ මාතර රාහුල කණ්ඩායම පරදවා පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය ලකුණු 11 ක ජයක් වාර්තා කරන ලදී. තරඟාවලිය පැවැත්වුනේ 2019 අප්‍රේල් 05, 06, 07 දිනයන්හි කොළඹ පී. සරා ඕවල් ක්‍රීඩාංගනයෙහිදී ය.

කාසියේ වාසිය දිනා ප්‍රථමයෙන් පන්දුවට පහර දුන් පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය කණ්ඩායම තම පන්දු වාර 50 අවසානයේදී කඩුළු 9 ක් දැවී ලකුණු 215ක් රැස් කර ගන්නා ලදී. විහඟ ගුණරත්න (55) හා අවිශ්ක හසරින්ද (36) පිත්තෙන් දස්කම් දැක්වූ අතර මාතර රාහුල පිල වෙනුවෙන් තමිර චන්දික හා චමුදිත ඩිල්ශාන් කඩුළු 3 බැගින් දවා ගන්නා ලදී.

> තරඟාවලියේ හොඳම පිතිකරුවා සහ හොඳම පන්දු යවන්නා සඳහා පෙරමග දශක කණ්ඩායමේ අනුග්‍රහයෙන් **ක්‍රිකට් පිත්තක් සහ ක්‍රිකට් පාවහන් යුගලක් පිරිනමන ලදී.** ක්‍රිකට් පිත්ත සඳහා අනුග්‍රහය ලබා දුන්නේ පෙරමග හිටපුසභාපති රසික රණසිංහ මහතායි.

පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ මාතර රාහුල පිලට ලබාගැනීමට හැකි වූයේ සියළු දෙනා දැවී ලකුණු 204 ක් පමණි. ධර්මපාල පිල වෙනුවෙන් දුලාජ් එගොඩගේ ලකුණු 32 කට කඩුළු 3ක් ද, තරිඳු සඳරුවන් ලකුණු 25 ට කඩුළු 2ක් ද දවා ගන්නා ලදී. රාහුල විද්‍යාලයේ සසිඳු අවිශ්ක පන්දු 32 කදී ලකුණු 41 ක් රැස් කිරීමට සමත් විය.

හොඳම පිතිකරුවා හා තරඟයේ වීරයා ලෙස ධර්මපාල විද්‍යාලයේ විහඟ ගුණරත්නද හොඳම පන්දු යවන්නා ලෙස රාහුල විද්‍යාලයේ තමිර චන්දිකද සම්මාන දිනා ගන්නා ලදී. මෙතෙක් පැවති එක් දින තරඟ හතරෙන් තුනක ජය ලබා ඇත්තේ පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයයි.

මේ අතර අට වැනි වරට පැවැත් වූ රන් සිංහයන්ගේ මහා ක්‍රිකට් තරඟය ජය පරාජයෙන් තොරව අවසන් විය. ධර්මපාල විද්‍යාලයේ චමිදු සමරසිංහ, අමිල දයන්ත, නවිඳු නවීන්, සංඛන ලංකා, කවින්ද උෂාන් සහ මාතර රාහුල විද්‍යාලයේ සසිත් මනුරංග, තරිඳු රාජපක්ෂ හා පසිදු අවිශ්ක යන ක්‍රීඩකයන් මෙම තරඟය පැවති දෙදින පුරා කැපී පෙනෙන දස්කම් දැක්වීමට සමත් විය.

> පැවති එක්දින තරඟයේ තවත් සුවිශේෂී අවස්ථාවක් වන්නේ ධර්මපාල විද්‍යාලීය **ක්‍රීඩකයන්ගේ නිල ක්‍රීඩා ඇඳුම** පෙරමග දශක කණ්ඩායමේ පූර්ණ අනුග්‍රහකත්වයෙන් නිර්මාණය වීමයි.

**ධර්මපාල විද්‍යාලය** : ප්‍රථම ඉනිම - පන්දු වාර 71 කදී 378/5 (චමිඳු සමරසිංහ 104, අමිල දයන්ත 69, නවිඳු නවීන් 55, පසිඳු අවිශ්ක 2/68) සහ දෙවෙනි ඉනිම 44/2 (නවිදු නවීන් 25, සසිත් මනුරංග 2/29)

**රාහුල විද්‍යාලය** : ප්‍රථම ඉනිම - පන්දු වාර 161 කදී සියළු දෙනා දැවී 330 ( සසිත් මනුරංග 141, තරිඳු රාජපක්ෂ 97, සංඛන ලංකා 3/29, කවින්ද නිශාන් 3/45, චමිඳු සමරසිංහ 2/83)

✍ හියල් චතුර බියගමගේ
Source : papare.lk

# 2019/2020 වර්ෂයේ වැඩසටහන් පෙළගැස්ම

## ගෘහස්ථ සංගීත ප්‍රසංගය

### (ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය)

පෙරමග දශක කණ්ඩායම විසින් පසුගිය වර්ෂ කිහිපය පුරාවටම සිය ප්‍රධාන මූලෝත්පාදන ව්‍යාපෘතිය ලෙස අති සාර්ථක ගෘහස්ථ සංගීත ප්‍රසංග කීපයක්ම පවත්වා ඇත. මෙවරද ප්‍රධාන ව්‍යාපෘති කිහිපයකටම අරමුදල් සපයාගනු වස් ගෘහස්ථ සංගීත ප්‍රසංගයක් මහරගම ජාතික තරුණ සේවා සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. දිවයිනේ ජනප්‍රියතම සංගීත කණ්ඩායමක් වන **වායෝ සංගීත කණ්ඩායම** සමග **ප්‍රවීණ ගායන ශිල්පිනී මරියසෙල් ගුණතිලක සහ යෞවනයේ ජනප්‍රිය ගායන ශිල්පී ශිහාන් මිහිරංග** ගීතවත් වන මෙම සංගීත ප්‍රසංගය අපේක්ෂිත ආදායම් ඉලක්ක කරා ගෙන යාම පෙරමග දශක කණ්ඩායමේ අරමුණයි. ප්‍රධාන අරමුණට පරිබාහිරව මෙම ප්‍රසංගය සාර්ථක කර ගැනීම උදෙසා සියලු පෙරමග සාමාජිකයන් ඒකරාශී කරගැනීම, ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට සහ පෙරමග ශක්තිය විදහා පෑම යනාදී අනිකුත් උප අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂිතය. මෙම සංගීත ප්‍රසංගය පෙරමග දශක කණ්ඩායමේ අප්‍රතිහත ධෛර්යය හා මිත්‍රත්වය පිළිබිඹු කරන සන්ධිස්ථානයක් වනු නොඅනුමානය.







## වැසිකිළි ව්‍යාපෘතිය, ගණිතාගාරය පසුවිපරම සහ නාම පුවරු අළුත්වැඩියාව

පෙරමග දශක කණ්ඩායම විසින් පාසලේ දරු දැරියන්ට තිළිණ කළ වැසිකිළි සංකීර්ණයෙහි සහ ගණිතාගාරයෙහි දැනට පවතින අඩුපාඩු සහ අළුත්වැඩියා අවශ්‍යතා සොයා බලා සම්පූර්ණ කර දීම මෙයින් අපේක්ෂිතය. මෙය වාර්ෂිකව අඛණ්ඩව සිදු කිරීමට බලාපොරොත්තු වන අතර ඒ හරහා මෙම වත්කම් වල වටිනාකම තවදුරටත් වැඩි කර ගැනීමටත් දරුවන්ට මේවායින් උපරිම ඵල ප්‍රයෝජනයක් ලබා ගැනීමට අවස්ථාව සැලසීමටත් අනාගත සිසු පරපුරටත් මේවා යහපත් තත්ත්වයෙන් යුතුව දායාද කිරීමත් අරමුණු වේ. පෙරමගින් අප පාසලේ සිසු දරුවන්ට දායාද කළ තවත් වැදගත් ව්‍යාපෘතියක් ලෙස නාම පුවරු ප්‍රදර්ශනය හැඳින්විය හැකිය. දරුවන්ට ආදර්ශයක් ගත හැකි සිතන්නට යමක් ඉතිරි කරන මෙම නාම පුවරු අඛණ්ඩව අළුත්වැඩියා කිරීම සහ නව නාමපුවරු පාසලට ලබා දීම මේ යටතේ සිදු කිරීමට අපේක්ෂිතය. ඒ හරහා මෙම වටිනා නාම පුවරු විනාශ වන්නට නොදී ඉදිරි සිසු පරම්පරාවටද ප්‍රයෝජනයක් ගත හැකි ලෙස නිසි පරිදි නඩත්තු කර ඒවාට වටිනාකමක් එකතු කිරීම මෙහි මූලික අරමුණ වේ.

පරිගණක විද්‍යාගාරය අසල
# දැල්වැට ප්‍රතිසංස්කරණය




විද්‍යාලයේ පරිගණක ඉගෙනුම් මධ්‍යස්ථානය පිටුපස ඇති මාර්ගයට හා ඊට පහළින් පිහිටි ප්‍රාථමික අංශයේ ගොඩනැගිලි අතර ඉදිකර ඇති දැල් වැට එහි කණුවලින් ගැලවී අබලන් තත්ත්වයට පත් වී ඇති බැවින් එය ප්‍රතිසංස්කරණය කර පාසලට ලබා දීම මේ යටතේ සිදුවේ. පෙරමග දශක කණ්ඩායමේ කෙටිකාලීන ක්ෂුද්‍ර ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීමට අපේක්ෂිත මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ අබලන් දැල් වැට හේතුවෙන් සිසු දරුවන්ගේ ආරක්ෂාවට එල්ල වී ඇති තර්ජනය තුරන් කිරීමය.

# අබලන් පුටු මේස සකස් කරදීම




පසුගිය වර්ෂයේදීත් පෙරමග දශක කණ්ඩායම විසින් අතිසාර්ථකව නිමකළ ව්‍යාපෘතියකි. මේ හරහා දැනට පාවිච්චියට නොගෙන අත්හැර දමා ඇති නමුත් අළුත්වැඩියා කර තවදුරටත් භාවිතා කළ හැකි අබලන් පුටු මේස ඉහළ ප්‍රමිතියකින් යුතුව අළුත් වැඩියා කර පාසලට ලබා දීම සිදු කෙරේ. මෙතුලින් තවදුරටත් පාවිච්චි කළ හැකි පාසලේ භෞතික සම්පත් නිසි අලුත්වැඩියාවකින් පසුව මතු පරපුරට ලබා දීම ප්‍රධාන අරමුණයි. එසේම ව්‍යාපෘතියේ උප අරමුණු ලෙස මේ හරහා පෙරමග සාමාජිකයින්ට ශ්‍රම පැය එකතු කර ගැනීමට අවස්ථාව සැලසීම, සාමාජිකයින් වැඩි පිරිසක් ඵලදායීව ඒකරාශි වීම සහ සාමාජිකයින්ගේ සුහදත්වය වර්ධනය කරලීම යනාදිය දැක්විය හැක. මේ ව්‍යාපෘතිය තුළින් මෙම වටිනා භෞතික සම්පත් විනාශ වන්නට නොදී මතු පරපුරට ඵලදායී ලෙසින් දායාද කිරීම පෙරමග අපගේ ඒකායන අරමුණයි.

පෙරමග දශක කණ්ඩායම
නියෝජනය වන පරිදි
# වාර්ෂික පුවත් පත්‍රිකාව එළි දැක්වීම

FINISHED PROJECT

පෙරමග දශක කණ්ඩායම නියෝජනය වන පරිදි වාර්ෂිකව පුවත් සඟරාවක් මුද්‍රණය කර සාමාජිකයින් අතට පත් කරලීම මෙම ව්‍යාපෘතියෙන් සිදු කෙරේ. මෙහි මූලික අරමුණු ලෙස පෙරමග දශක කණ්ඩායම විසින් වාර්ෂිකව සිදු කරන ව්‍යාපෘති පිළිබඳ සාමාජිකයින් දැනුවත් කිරීම, සාමාජික ප්‍රවර්ධනය, සාමාජිකයින්ගේ නිර්මාණාත්මක අදහස් වලට ඉඩහසර ලබා දීම, යනාදිය දැක්විය හැකි අතර ඊට අමතරව මෙතුළින් සමස්ත ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රවර්ධන කටයුතු සඳහා සහයක් ලබා දීම හා පාසලේ උන්නතිය සඳහා කටයුතු කිරීමට සහයක් ලබා දීමටද අපේක්ෂිතය. ඇලුමැති පාර්ශ්ව හට අවශ්‍ය තොරතුරු විධිමත්ව සපයාදීමේ ක්‍රමවේදයක් ලෙස මෙය හැඳින්විය හැකි අතර කණ්ඩායමේ දැක්ම සාක්ෂාත් කරගැනීමට යන ගමනේදී සියලුම සාමාජිකයින් අඛණ්ඩව පෙරමග සමග රඳවා ගැනීමට මෙය රුකුලක් වනු නොඅනුමානය.

# පොඩි වල ව්‍යාපෘතිය
(පෙරමග වේදිකාව)

'වල' යන නාමය සමග නිතැතින්ම අපගේ මතකයට නැගෙනුයේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉදිකර ඇති එළිමහන් රංග පීඨයයි. දිවයිනේ සියලු වේදිකා නාට්‍ය ශිල්පීන්ගේ විශාල සිහිනයක් බවට වලෙහි තම නාට්‍යයක් පෙන්වීම වන තරමට ම අති විශාල ජනාදරයකට පත් මෙම ස්ථානය සෞන්දර්යාත්මක තෝතැන්නකි. උක්ත ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ අප පාසලට වල වැනි එළිමහන් රංග පීඨයක්




(Open) පරිත්‍යාග කිරීමයි. ඒ හා සබැඳි අනිකුත් අරමුණු ලෙස එළිමහන් රංග පීඨයක් මගින් විද්‍යාලයීය සිසු දරු දැරියන් සෞන්දර්ය විෂයන් කරා ආසක්ත කරවීම, වෙනත් පාසල් වල එවැනි වේදිකා නැති බැවින් පාසලටත් පෙරමගටත් ඒ හරහා විශාල කීර්ති නාමයක් අත්කර ගැනීම, එහි නාට්‍ය සංදර්ශන ආදිය පැවැත්වීමට ඉඩ ලබා දී එයින් මුදල් ඉපයීම සහ පෙරමගට, පාසලට හා අනිකුත් ආදි සිසු කණ්ඩායම් සැමට වෙනත් ව්‍යාපෘති කරා යෑමට රිසි වේදිකාවක් තනාදීම දැක්විය හැක. අතීතයේ පටන්ම ධර්මපාලය මුලු රටක් ආදරය කරන අති දක්ෂ කලාකරුවන් රැසක් ලක්මවට දායාද කර දී ඇත. ඉදින් ඉදිරි සිසු පරපුරටත් සිය කලාකාමී හැකියාවන් තව තවත් ඔප මට්ටම් කර ගැනීමට හා එතුළින් තම ජීවිත වේදිකාවට හොඳ පන්නරයක් ලබා ගැනීමට පෙරමග වේදිකාව ඔවුන්ට අභිර්වාදයක් වනු ඇතැයි පෙරමග දශක කණ්ඩායමේ පැතුමයි.

# පෙරමග පොකුර

පෙරමග සාමාජිකයින්ගේ දත්ත එක්රැස් කොට දත්ත ගබඩාවක් සකසා අඛණ්ඩව යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම මේ හරහා සිදු කෙරේ. පෙරමගින් සිදු කරන ව්‍යාපෘති වලදී මෙන්ම වෙනත් අවශ්‍ය කටයුතු වලදී




සාමාජිකයින්ගේ දත්ත එකී අවශ්‍ය වේලාවේදී අවශ්‍ය ප්‍රමාණයෙන් ඉක්මනින් ලබා ගැනීමට නොහැකි වීම අප දශක කණ්ඩායම මුහුණ දෙන ගැටළුවකි. සාමාජික ප්‍රමාණය ඉහළ යත්ම අවශ්‍ය දත්ත ක්ෂණිකව ලබා ගැනීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. ඊට විසඳුමක් ලෙස සාමාජික දත්ත පරිගණක ගත කර පවත්වාගෙන යාම මෙම ව්‍යාපෘතියෙන් සිදු කෙරේ. මූලික අරමුණට පරිබාහිරව මේ තුළින් පෙරමග සම්පත් දායකයින් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, එම සම්පත් අප ව්‍යාපෘති සඳහා නිසි පරිදි දායක කර ගැනීම, ඔවුන්ටද පෞද්ගලික වාසි සහගත අවස්ථා මතු කර දීම හා දීර්ඝකාලීනව පෙරමග සමග රැඳී සිටීමට ඔවුන් දිරි ගැන්වීම අපේක්ෂා කෙරේ. මෙහිදී දත්ත වෘත්තීමය වශයෙන් (උදා : වෛද්‍ය, ව්‍යාපාරික ආදි ලෙස) වෙන් කෙරෙන අතර එතුළින් පෙරමගෙහි අවශ්‍යතාවන්ට පමණක් නොව සමස්ත ආදි ශිෂ්‍ය සංගමයෙහිම අවශ්‍යතා සඳහා වෘත්තිකයින් ඉක්මනින්ම ලබා ගත හැකි වනු ඇත. ඒ අනුව විශේෂ වාසි රැසක්ම ජනිත කරවන ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙය හැඳින්විය හැක.

දම්පල් සෞන්දර්ය නිකේතනය
හා එක්ව **තරඟාවලියක් සංවිධානය කර ත්‍යාග හා සහතිකපත් ලබා දීම**

වර්තමානය වන විට සිසු පරපුර විෂය අධ්‍යාපනයට වැඩි නැඹුරුවක් පෙන්වන අතර සිය කලාකාමී සෞන්දර්යාත්මක කුසලතා ඔපමට්ටම් කර ගැනීම කෙරෙහි දක්වන අවධානය අඩුවී ඇති බව පෙනේ. විද්‍යාලය තුළ දරුවන්ට ඒ සඳහා විවිධ පහසුකම් සපයා දී ඇතත් ඒ සඳහා ඔවුන්ගේ යොමු වීම අවම වී ඇත. මීට කදිම විසඳුමක් ලෙස පෙරමග දශක කණ්ඩායම උක්ත ව්‍යාපෘතිය හඳුන්වා දී ඇත. මෙහිදී විද්‍යාලයෙන් ලක් මවට දායාද වුනු කලාකරුවන්ගේ මෙන්ම රටෙහි ජනාදරයට පත් දක්ෂ කලාකරුවන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙන් දරු දැරියන්ගේ සෞන්දර්ය විෂයානුබද්ධ දැනුම හා ප්‍රායෝගික දැනුම නංවාලනු වස් වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීම සිදුවේ. එමෙන්ම තෝරාගත් සෞන්දර්ය විෂයන් (සංගීත, නැටුම්, නාට්‍ය, චිත්‍ර, ඡායාරූපකරණය ආදී) ආශ්‍රයෙන් විද්‍යාලයීය තරඟයක් සංවිධානය කර ත්‍යාග හා සහතිකපත් පිරිනැමීමට අපේක්ෂිතය. මේ හරහා සිසු දරුවන් තුල සෞන්දර්ය විෂය දැනුම නංවාලීම සේම ප්‍රායෝගිකව දරුවන්ගේ කලා කුසලතා එළිදැක්වීම හා ඊට ඔවුන්ගේ යොමුව දිරිමත් කිරීම පෙරමග දශක කණ්ඩායම අපේක්ෂා කරයි.

10 වෙනි පිට බලන්න...

9 වෙනි පිටුවෙන්...

## පෙරමග දියවර

පාසලේ සිසු දරු දැරියන්ට සිය අධ්‍යාපන කටයුතු මැනවින් සිදු කර ගෙන යාමට සඳහා මූලික අවශ්‍යතා සම්පූර්ණ වී තිබිය යුතුය. ජලය මූලික මිනිස් අවශ්‍යතාවයක් සේම රැකගත යුතු අමිල සම්පතකි. ප්‍රාථමික අංශයේ ජල නල පද්ධතියේ සිදු විය යුතු අළුත්වැඩියාවන් කිහිපයක් පිළිබඳව පෙරමග නිරීක්ෂණය කර ඇත. මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රාථමික අංශයේ ජල නළ පද්ධතිය අලුතෙන්ම ස්ථාපිත කිරීමට නියමිත අතර ඒ හරහා දරුවන්ට වඩා විධිමත්ව ජලය අරපිරිමැස්මකින් යුතුව අවම අපතේ යාමකින් පරිහරණය කිරීමට සැමට උත්තේජනයක් ලබා දීම අපේක්ෂිත වේ.

අ.පො.ස සා/පෙළ සිසුන්ට

## ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සම්මන්ත්‍රණයක් පැවැත්වීම

කෙටිකාලීන අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ සාමාන්‍ය පෙළ කඩඉම අභිමුව සිටින සිසුන්ට ඒ සඳහා පිටුවහලක් සැපයීමයි. මෙහිදී සුදුසුකම් ලත් ගණිත ආචාර්යවරුන්ගේ සහාය ලබා ගැනීමට අපේක්ෂිත අතර මුද්‍රිත නිබන්ධන කට්ටලයක් ලබා දීම තුළින් සිසුන්ට සම්මන්ත්‍රණයේ සාකච්ඡා වූ කරුණ පුනරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දීම සිදු කෙරේ. මේ හරහා විද්‍යාලයේ සා/පෙළ ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි සමත් ප්‍රතිශතය වර්ධනය කිරීම තුළින් පාසලේ කීර්තිනාමය වර්ධනය කරලීම අපේක්ෂිතය.

සය සාමාජික

## ක්‍රිකට් තරඟාවලිය

පෙරමග සමාජිකයින්ගේ සුහදත්වය හා එකමුතුකම පිළිබිඹු කරනු වස් වර්ෂ 11 ක් පුරාවටම පැවති අති සාර්ථක වැඩසටහනක් ලෙස




මෙය හැඳින්විය හැකිය. පසුගිය වසරේ පැලවත්ත බුද්ධදාස ක්‍රීඩාංගනයේදී පැවැති මෙම තරගාවලිය සඳහා කණ්ඩායම් 22 ක් සහභාගී විය. අඛණ්ඩව සෑම වසරකදීම පෙරමග දශක කණ්ඩායම විසින් පවත්වන සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය මෙම වසරේදීත් පැවැත්වීමට බලාපොරොත්තු වේ. මෙහි ප්‍රධාන අරමුණු ලෙස සාමාජිකයින්ගේ සුහදත්වය හා එකමුතුකම වර්ධනය කිරීම, සාමාජිකයින්ට හා පවුලේ අයට විනෝද වීමට අවස්ථාව සලසා දීම, සාමාජිකයන් පෙරමග තුළ රඳවා ගැනීම, සාමාජිකයින්ගේ දක්ෂතා පෙන්වීමට අවස්ථාව සලස දීම යනාදිය දැක්විය හැක.

## දම්පල් පෙරමග කුසලානය

මෙහිදී යම් තෝරාගත් ක්‍රීඩාවක් සඳහා (උදා : රගර්, බැඩ්මින්ටන්, නෙට්බෝල්, බාස්කට් බෝල් ආදි) වාර්ෂිකව අන්තර් පාඨශාලීය තරගාවලියක් සංවිධානය කර ජයග්‍රාහකයන්ට "දම්පල් පෙරමග" නමින් කුසලානයක් ලබාදී එකී නාමය ව්‍යාප්ත කර ලීම සිදු වේ. මෙතුළින්



පෙරමග සන්නාමය විද්‍යාලය තුලත් ඉන් පිටතත් ජනප්‍රිය කරලීම අපේක්ෂා කෙරේ. එමෙන්ම මේ හරහා එම තෝරාගත් ක්‍රීඩාවට අදාළව දරුවන් අභිප්‍රේරණය කිරීම, විද්‍යාලයීය කීර්තිනාමය නංවාලීම සේම ක්‍රිකට් වලට සමගාමීව පවතින 'රන් සිංහයින්ගේ සටන' ට ලැබෙන දරුවන්ගේ ආකර්ෂණය වෙනත් ක්‍රීඩාවක් කරාද යොමු කරලීම අපේක්ෂා කෙරේ.

## සුවැති පෙරමග

6, 7, 8, 9 ශ්‍රේණිවල පාසල් දරුවන්ගේ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම මූලික අරමුණ වූ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස සුවැති පෙරමග ව්‍යාපෘතිය හැඳින්විය හැක. වර්තමානය වන විට ළමා පරපුර අතර වැරදි ආහාර පුරුදු පරිභෝජන රටා ආදිය හේතුකොට ගෙන අධික ස්ථුලතාවය, දියවැඩියාව සහ තවත් බෝ නොවන රෝග ව්‍යාප්ත වීමේ වැඩි අවදානමක් පවතී. මීට ප්‍රධාන වශයෙන් නොසැළකිල්ල මෙන්ම නොදැනුවත්කමද බලපා ඇත. මීට පිළියමක් ලෙස මහරගම දන්ත වෛද්‍ය ආයතනය, ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ස්වේච්ඡාවෙන් සමාජ සේවයන් හට යෙදවූ රජයේ වෛද්‍යවරුන් යනාදීන් සම්බන්ධ කොටගෙන පාසලේ සෞඛ්‍යදාන සංගමයේද සහය ඇතිව දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ වෛද්‍ය සායනයක් පැවැත්වීම මෙම ව්‍යාපෘතිය හරහා සිදු කෙරේ.

## පෙරමග විදුජය

දැනට අප විද්‍යාලයේ උ/පෙළ විද්‍යා හා ගණිත අංශ වල ප්‍රතිඵල කලා හා වාණිජ විෂයන්ට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. ඊට විසඳුමක් ලෙස මෙම ව්‍යාපෘතිය පෙරමග දශක කණ්ඩායම විසින් යෝජනා කෙරේ. මේ යටතේ පාසලේ දැනට පවත්නා උසස් පෙළ භෞතික හා රසායන විද්‍යා විද්‍යාගාරයන්හි පවත්නා අඩුපාඩු සකස් කර අංග සම්පූර්ණ විද්‍යාගාර දෙකක් පාසලට ලබා දීම හා ඒවා නිසි කළමණාකාරීත්වයකින් යුතුව පවත්වාගෙන යාම සිදු කෙරේ. මෙහි කෙටිකාලීන අරමුණු වශයෙන් මෙම විද්‍යාගාරයන්හි සිදු කරන සියලුම ප්‍රායෝගික පරීක්ෂණ 100% ඉටුකිරීමට අවශ්‍ය භෞතික සම්පත් සැපයීම, ඒ හරහා සිසුන්ට ප්‍රායෝගික පරීක්ෂණ තුලින් ලබා ගත හැකි අනිවාර්ය ලකුණු ප්‍රමාණය උපරිමයෙන් ලබා ගැනීමට ඉඩහසර ලබා දීම හා උසස් පෙළ විද්‍යා ගණිත ප්‍රතිඵල සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීමට සහයෝගය ලබා දීම යනාදිය දැක්විය හැක. ව්‍යාපෘතියේ දිගු කාලීන අරමුණු වන්නේ උ/පෙළ විද්‍යා, ගණිත ප්‍රතිඵල ඉහළ නැංවීම හරහා පාසලේ කීර්තිනාමය වැඩිවීම තුළින් තරග විභාග ප්‍රතිඵල මත වැඩිමනක් දක්ෂ සිසුන් පාසලට ඇතුලත් කර ගැනීමට ඉඩහසර ලැබීම සහ ඒ හරහා තරග විභාග සඳහා ඉහළ ප්‍රතිඵල අඛණ්ඩව ලබා ගැනීම තුළින් වර්ධනය වන පාසලේ කීර්ති නාමය දිගුකාලීනව පවත්වාගෙන යාමයි. මෙය දිගුකාලීන අඛණ්ඩ ව්‍යාපෘතියක් වන අතර මේ හරහා පාසලේ උ/පෙළ විද්‍යා ගණිත ප්‍රතිඵල සඳහා වඩා සාධනීය වෙනසක් ඇති කරලීම පෙරමග අපගේ බලාපොරොත්තුවයි.

## පෙරමග වාර්ෂික සුහද හමුව

වර්ෂය පුරාවට පෙරමග දශක කණ්ඩායමේ ව්‍යාපෘතීන් සඳහා ඇප කැපවී සහයෝගය ලබා දෙන පෙරමග සාමාජිකයින්ට ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සුහදත්වය වර්ධනය කර ගනිමින් විනෝද වීමට අවස්ථාව ලබා දීම මෙහි ප්‍රධාන අරමුණයි. පසුගිය වර්ෂයේදී විනෝද චාරිකාවක් සංවිධානය වූ අතර මේ වසරේදී විනෝද චාරිකාවක් හෝ සාමාජිකයින් පහසුවෙන් ඒකරාශී විය හැකි හෝටල් පරිශ්‍රයක මෙම සුහද හමුව පැවැත්වීමට බලාපොරොත්තු වේ. මෙමගින් පෙරමග සාමාජිකයින් අතර සුහදතාවය වඩාත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරමු.

දුෂ්කර පාසලකට අවශ්‍ය

## පාසල් උපකරණ ලබා දීම

සාමාජීය වගකීම ඉටුකරලීම අරමුණු කර ගනිමින් උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලීමට පෙරමග දශක කණ්ඩායම අපේක්ෂා කරයි. මෙහිදී දුෂ්කර පාසලක් තෝරාගෙන එහි සිසු දරුවන්ට අවශ්‍ය කරන පාසල් උපකරණ, පොත්පත් යනාදිය පරිත්‍යාග කිරීම සිදුවේ. පෙරමග දශක කණ්ඩායම වනාහි පාසලට පමණක් සීමා නොවී සාමාජීය අවශ්‍යතා වලටද සිය මෙහෙවර පතුරාලන සාමාජීය වගකීමට බැඳුණු කණ්ඩායමකි. එය වඩාත් පිළිබිඹු කරනු වස් පසුගිය වර්ෂ වල සේම මෙම වසරේදීත් මෙම සත්කාරය සිදු කිරීමට අප ඇප කැපවී සිටිමු. එමගින් පෙරමග දශක කණ්ඩායමේ මෙන්ම අප විද්‍යාලයේ කීර්ති නාමය පැතිරවීම අපේක්ෂා කෙරේ.

## සාමාජික ප්‍රවර්ධන වැඩසටහන

පෙරමග මගින් සිදුකරන සියලු ව්‍යාපෘතීන්ට සමගාමීව සාමාජික ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරලීමට පෙරමග දශක කණ්ඩායම බලාපොරොත්තු වේ. ඒ තුළින් තව තවත් නව සාමාජිකයන් අප සංගමය හා අත්වැල් බැඳගැනීමට කටයුතු සැලැස්වීම මෙහි අරමුණයි. කණ්ඩායමක ප්‍රධාන වත්කම එම කණ්ඩායමේ සාමාජිකයන් වේ. එම නිසා මෙම වටිනා වත්කම තව තවත් වර්ධනය කර ගැනීමට වැඩසටහන් දියත් කළ යුතුය.

ඊට ඇරඹුමක් ලෙස ආදි ශිෂ්‍ය සංගමයේ සිදු කරන ඕනෑම වැඩසටහනකට පෙරමග ලාංඡනය සහිත කුඩයක් සහිතව පෙරමග සාමාජිකයින් කිහිප දෙනෙක් සාමාජික ප්‍රවර්ධනය සඳහා සහභාගී වීම සිදු කෙරේ. ඊට අමතරව වසර පුරාම සිදු කරන විවිධ ව්‍යාපෘති වලදී මෙම නව සාමාජිකයින් ඒ බඳවා ගැනීමේ ක්‍රියාවලිය උත්තේජනය කිරීමට ක්‍රියාමාර්ග රැසක් ගැනීමට නියමිතය.

✍ දිනේෂා ජයමාන්න, නිළිණි ශ්‍යාලිකා,
දිලිනි ලාංකිකා

**12 YEARS OF FRIENDSHIP 2007 - 2019**

**පෙරමග දැක්ම :** දැනුමැති සමාජයක් උදෙසා ධර්මපාල චින්තනයෙන් පිරිපුන් සුවිශේෂී නිපුණතාවන්ගෙන් යුතු ගුණගරුක පුරවැසියන් නිර්මාණය කිරීම.

**පෙරමග අරමුණු :** විද්‍යාලයේ දියුණුව හා ආදි ධර්මපාලියන්ගේ සුභසාධනය

# නව සාමාජිකත්වය ලබාගන්නේ කෙසේද?

✍ අරුණි ලියනගේ, මේබලා නදීශානි




**Membership Hut**

පෙරමග දශක කණ්ඩායම විසින් සංවිධානය කරන ඕනෑම උත්සවයකදී/ විශේෂ අවස්ථාවකදී Membership Hut පහසුකම මගින් නව සාමාජිකත්වය ලබාගැනීමට කටයුතු සලසා ඇති බව සතුටින් දැනුම් දෙමු.

### සාමාජිකත්වය ලබාගත හැක්කේ කාටද?

පාසලෙන් ඉගෙනුම ලබා ඉවත් වූ ඕනෑම ආදි ධර්මපාලියෙකුට ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය ලබාගත හැක. ඒ අතරින් 2001-2010 අතර වර්ෂයකදී (හෙවත් උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂය) පාසලෙන් ඉවත් වූ ධර්මපාලීයයන්ට පෙරමග දශක කණ්ඩායමේ සාමාජිකත්වය ලබාගත හැක.

### අවශ්‍ය ලියකියවිලි මොනවාද?

1. අස්වීම් සහතිකයේ පිටපතක් හෝ එය නොමැති නම් විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පතිතුමා විසින් ශිෂ්‍යභාවය සනාථ කිරීමේ සහතිකයක්,
2. පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 3ක්,
3. ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්ව ඉල්ලුම්පත (කාර්යාලයෙන් ලබාගත හැක.)
4. පෙරමග දශක කණ්ඩායමේ සාමාජිකත්ව ඉල්ලුම්පත (කාර්යාලයෙන් ලබාගත හැක.)


| | ඇතුළත් වීමේ ගාස්තු | මව් සංගමයේ සාමාජික ගාස්තු | පෙරමග සාමාජික ගාස්තු | මුළු එකතුව |
|---|---|---|---|---|
| **යාවජීව සාමාජිකත්වය** | නැත | රු.4,000.00 | රු.1,000.00 | **රු.5,000.00** |
| **සාමාන්‍ය සාමාජිකත්වය** | රු.100.00 | රු.1,000.00 | | **රු.2,100.00** |

### සැලකිය යුතුයි.

1. සාමාන්‍ය සාමාජිකත්වය වසරකට පමණයි. සාමාන්‍ය සාමාජිකත්වය සඳහා වූ වාර්ෂික මුදල එම වර්ෂයේම දෙසැම්බර් 31ට හෝ ඊට පෙර ගෙවිය යුතුය. නැතහොත් සාමාජිකත්වය අහෝසි වේ.
2. සාමාන්‍ය සාමාජිකත්වය ලබාගත් අයෙකුට යාවජීව සාමාජිකත්වය ලබාගැනීමට අවශ්‍ය වේ නම් වසරක් ඇතුළත ඉතිරි මුදල (රු. 3,000 = රු. 1,000 × 3) ගෙවා ලබාගත හැකිය.
3. සෑම යාවජීව සාමාජික/ සාමාජිකාවකටම **හැඳුනුම්පත අනිවාර්ය වේ.** ඒ අනුව පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 03ක් සමග අදාල අයදුම්පත්‍රය සම්පූර්ණ කර රු.200/- ක මුදලක් සංගමය වෙත ගෙවිය යුතුය. හැඳුනුම්පත සකස් වූ වහාම ඒ බව දැනුම් දෙන අතර එය පැමිණ ලබා ගත හැක.
4. ඔබ මෙතෙක් අස්වීම් සහතිකය ලබාගෙන නොමැති නම් එය අඟහරුවාදා හෝ බ්‍රහස්පතින්දා දෙදින තුළ පෙ.ව.7.30 - ප.ව.1.30 අතර විද්‍යාලයීය කාර්යාලයෙන් ලබාගත හැක.


**විමසීම්**

**ආදි ශිෂ්‍ය සංගමය, ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.**
දුරකථන : 0112 843 207 | 0114 328 966 විද්‍යුත් ලිපිනය : ppadvp@gmail.com
වෙබ් අඩවිය : www.dharmapalappa.lk


## 13 වන මහ සභා වාර්තාවෙහි සාරාංශය

ක්‍රි.ව. 2019 ක් වූ පෙබරවාරි මස 10 වන දින පෙ.ව. 9.00 ට විද්‍යාලයීය ආපන ශාලාවේ උඩුමහලේ දී සියලු පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් සභාවේ වැඩකටයුතු ආරම්භ විය. 12 වන මහා සභා රැස්වීමට පැමිණි සියලු දෙනා පිළිගනිමින් ගරු ලේකම් වෙනුර කසුන්සිරි මහතා පිළිගැනීමේ කථාව පැවැත්වූ අතර පැමිණ සිටින සියලු දෙනා වෙත ලබා දී තිබූ 11 වන මහ සභා වාර්තාව සහ 2018 ජුලි මස 15 වන දින පැවති අතුරුමහ සභා වාර්තාව සත්‍ය වාර්තාවන් ලෙස සභා සම්මත විය.

ඉන් අනතුරුව පැවති ප්‍රගති සමාලෝචනයේදී 2018/2019 පරිපාලන වර්ෂයේ දී අප සංගමය මගින් සිදුකරන කරන ලද ව්‍යාපෘති පිළිබඳ ව ගරු සභාපති රුසිරු වගීෂ බැලගම මහතා කරුණු දැක්වූ අතර එහිදී 6-9 ශ්‍රේණි සඳහා ඉදි කරන ලද වැසිකිළි කැසිකිළි පද්ධතිය පිළිබඳව සවිස්තර විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී. ඉන්පසු ගරු භාණ්ඩාගාරික චමිල කසුන් දසනායක මහතා වර්ෂයට අදාළ ගිණුම් වාර්තා සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සංශෝධන රහිතව සත්‍ය වාර්තාවක් ලෙස සභා සම්මත විය. ඉන්පසු විදුහල්පතිතුමා විසින් සිය කථාවේදී පෙරමග කණ්ඩායම ආදි ශිෂ්‍ය සංගමයේ ශක්තිමත්ම කණ්ඩායම බව ප්‍රකාශ කල අතර වැසිකිළි ව්‍යාපෘතිය හරහා සිසුන්ගේ සනීපාරක්ෂණ මට්ටම ඉහල නැංවීමට කටයුතු කිරීම පිළිබඳ ව පෙරමග කණ්ඩායමට විශේෂයෙන් ස්තුති කරන ලදී.





මව් සංගමයේ ගරු නියෝජ්‍ය සභාපතිතුමන් සහ ගරු ලේකම්තුමා පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් පෙරමග දශක කණ්ඩායම සිදුකළ මෙහෙය අගය කළ අතර ඉදිරි වර්ෂයේදීත් පාසල වෙනුවෙන් සහය ලබා දෙන ලෙස ඉල්ලමින් තම කථාවන් අවසන් කරන ලදී. ඉන් පසුව පසුගිය වර්ෂයේ නිලධාරි මණ්ඩලය ඉල්ලා අස්වී නව නිලධාරි මණ්ඩලයක් සභාවේ බහුතර කැමැත්ත පරිදි තෝරා පත් විය. ඒ අනුව බුද්ධික රොෂාන් මහතා නව සභාපති ලෙසත් ගයානි කොස්වත්තගේ මිය නව ලේකම්තුමිය ලෙසත් පත්විය. ඉන්පසු එළඹි නව යෝජනා සහ අදහස් වාරයේදි නයෝමාල් ඉඹුලාන මහතා විසින් මහා සභා වාර්ථාව සමග අදාළ වර්ෂය තුල පැවති විධායක කමිටු රැස්වීම් සඳහා සහභාගි වූ කමිටු සාමාජිකයන් ගේ පැමිණීම පිළිබඳ වාර්ථාවක් අමුණන මෙන් ද ශමේන්ද්‍ර ධර්මසේන මහතා විසින් දැනට සාමාජිකයින් වෙත යවන අවුරුදු සුභ පැතුම් පත වෙනුවට සාමාජිකයින්ට උපන්දින සුභ පැතුම් පතක් යැවීමට ද යෝජනා කරන ලදී. ඉන්පසු එළඹි උප ලේකම්තුමාගේ ස්තුති කථාවෙන් අනතුරුව සභා තොමෝ සතුටින් විසිර ගියහ.

✍ දිනේෂා ජයමාන්න

# කාන්තා ක්‍රිකට් ලෝක කුසලානය 2021 දී ශ්‍රී ලංකාවට

දිනා දීම එකම බලාපොරොත්තුවයි..,



**ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකා, ධම්පල් ආදි සිසු ඕෂධී රණසිංහ සමඟ කෙටි පිළිසඳරක්**

ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ ක්‍රීඩිකාවක් වන ඕෂධී උදේශිකා රණසිංහ පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ 'පෙරමග' දශක කණ්ඩායමෙන් බිහි වූ දීප්තිමත් ආදි ශිෂ්‍යාවකි. 2009 වසරේදී ක්‍රිකට් ක්‍රීඩාවට යොමුවන ඇය මේ වන විට ඕවර 50 ලෝක කුසලාන 2 කදී හා 20-20 ලෝක කුසලාන 3 කදී ශ්‍රී ලංකාව නියෝජනය කර තිබේ. එමෙන් ම දක්ෂ තුන් ඉරියව් ක්‍රීඩිකාවක් ලෙස ඕෂධී පසුගියදා පැවති එංගලන්ත තරඟාවලියේ පිත්තෙන් හා පන්දුවෙන් දස්කම් දක්වන්නටද සමත් විය. 'පෙරමග' සඟරාව සමඟින් ඇය පසුගිය දිනක කෙටි පිළිසඳරකට සහභාගී විය.

## ක්‍රිකට් වැනි ක්‍රීඩාවක් තෝරාගන්නට සිතුනේ ඇයි?

මගේ පියා ක්‍රිකට් ක්‍රීඩාවට දැඩි කැමැත්තක් දක්වන්නෙක්. ඔහු ඉතා ආසාවෙන් ක්‍රිකට් තරඟ නරඹන ආකාරය මම කුඩා කාලයේදී දුටුවා. ඔහුත් සමඟින් එකට හිඳ තරඟ නරඹන විට මට නිතැතින්ම ක්‍රිකට් පිළිබඳ ආශාවක් ඇති වුණා. 2009 වසරේදී මට අවස්ථාවක් ලැබුණා කෝල්ට්ස් ක්‍රිකට් සමාජයට නවක ක්‍රීඩිකාවක් වශයෙන් සහභාගී වන්නට. එමෙන් ම ක්‍රීඩාවට තිබුණ ආශාවත්, කැපවීමත් නිසාම මට 2009 වසරේදීම ශ්‍රී ලංකා ජාතික කාන්තා ක්‍රිකට් සංචිතයට ද ඇතුළත් වීමට හැකියාවක් ලැබුණා.

මේ වන විට 20-20 හා ඕවර 50 ලෝක කුසලාන 5 කදී ශ්‍රී ලංකාව නියෝජනය කරන්නට මට වරම් ලැබී තිබෙනවා. කාන්තා ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ ක්‍රීඩිකාවක් වශයෙන් රටට කීර්තියක් ලබා දෙන්නයි නිරන්තරයෙන්ම උත්සාහ කරන්නේ.

## ක්‍රීඩාව සඳහා පාසලෙන් ලැබුණු පන්නරය කොයි වගේද?

ඇත්ත වශයෙන්ම මම ක්‍රීඩාවට යොමුවුණේ ධර්මපාලයට සමුදුන් පසුවයි. නමුත් මට පාසලේදී වෙනත් ක්‍රීඩාවන් රැසකට සහභාගී වන්නට හැකියාව ලැබුණා.

අපේ පාසල ක්‍රීඩාවට ඉමහත් ජනප්‍රියතාවයක් උසුලන පාසලක්. නොයෙකුත් ක්‍රීඩාවන්ට සහභාගී වී ලැබුණු අත්දැකීම් මම පසුකාලයකදී ක්‍රිකට් ක්‍රීඩාවටද එකතු කර ගත්තා. ගුරුවරුන්ගෙන් හා පුහුණුකරුවන්ගෙන් පාසලේදී ලැබුණු ගුරුහරුකම් ක්‍රිකට් ක්‍රීඩාවේ මේ තාක් දුර ගමනක් එන්නට මහත් ආශිර්වාදයක් වුණා.

## ක්‍රිකට් ක්‍රීඩාවට යොමු වුණාට පසුව පාසලෙන් ලැබුණු ප්‍රතිචාරය කොයි වගේද?

ඉතාමත් හොඳ ප්‍රතිචාරයක් ලැබුණා. පාසලේ පැවැත්වෙන ක්‍රීඩා තරඟ විශාල ප්‍රමාණයක ආරාධිත අමුත්තෙක් ලෙස සහභාගී වන්නට මට අවස්ථාව ලැබෙනවා. ජාතික කණ්ඩායම නියෝජනය කරන ක්‍රීඩිකාවක් ලෙස පාසලෙන් ලැබිය යුතු ගෞරවය නිසි ආකාරයෙන් ලැබෙනවා.

## පාසලෙන් බිහිවන අනාගත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔබ ලබාදෙන උපදෙස කුමක්ද?

ඉගෙනීම වගේම ක්‍රීඩාවත් ඉතාම වැදගත් දෙයක්. මම පෞද්ගලිකව විශ්වාස කරනවා ක්‍රීඩාවෙන් ඕනෑම පුද්ගලයෙකුට මිනිසුන් අතරට යන්නට පුලුවන් කියලා. මිනිසුන් කායිකව හා මානසිකව වැටී ඉන්න මොහොතක ඔවුන්ට දෙපයින් නගා සිටුවීමේ ශක්තිය ක්‍රීඩකයෙකු සතුව තිබෙනවා. ඒ නිසා ක්‍රීඩකයෙකු ලෙස සැමවිටම විනීත හා විනය ගරුක විය යුතුයි. ඒ වාගේම ඕනෑම ක්‍රීඩාවක් කණ්ඩායම් හැඟීම හා ආත්ම විශ්වාසය ගොඩ නඟා ගැනීමට මනා රුකුලක් ලබා දෙනවා. පුද්ගලයෙකු ලෙස සමාජයේ හොඳ නමක් දිනාගැනීමට එයත් වැදගත්.

## අනාගත බලාපොරොත්තු ගැන කතා කළොත් ?

මේ දිනවන බංග්ලාදේශ හා ඕස්ට්‍රේලියානු තරඟ සංචාර සඳහා කැපවීමෙන් පුහුණුවීම් වල නිරත වෙනවා. එමෙන් ම 2021 නවසීලන්තයේ පැවැත්වෙන ලෝක කුසලාන තරඟාවලිය සඳහා සුදුසුකම් ලබා ගන්නට මෙම තරඟාවලි දෙකම ඉතාමත් වැදගත් වෙනවා. මගේ ඒකායන බලාපොරොත්තුව 2021 කාන්තා ක්‍රිකට් ලෝක කුසලානය ශ්‍රී ලංකාවට දිනා දෙන්නයි. ඒ වගේම 2020 වසරේ ඕස්ට්‍රේලියාවේදී පැවැත්වීමට නියමිත 20 - 20 ලෝක කුසලානය පිළිබඳවත් යහපත් බලාපොරොත්තු රැසක් තබාගෙන ඉන්නවා.

✍ හියල් චතුර බියගම





# Best Wishes From

HSP
PLASTIC
PRODUCTS
Plastic Injection Moulding

NO 1
QUALITY PRODUCT
IN SRI LANKA




No. 86, Old Kasbewa Road, Rattanapitiya, Boralesgamuwa
Tel. +94 11 2 54 53 55 Fax. +94 11 2 54 55 58
Web. www.hspplastic.com E-mail. samilaplastic@gmail.com



# ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉදිරියටම යන්න පන්නරය ලබා දුන්නේ ධර්මපාලයයි

**වාහන ආනයන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ව්‍යාපාර හිමිකරුවකු වන ආසිරි ලියනගේ මහතා සමග කෙටි පිළිසඳරක්**

ශ්‍රී ලංකාවේ ඉතාම තරඟකාරී වෙළෙඳ ක්ෂේත්‍රයක් වන වාහන ආනයන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ව්‍යාපාර හිමිකරුවකු වන ආසිරි ලියනගේ මහතා "පෙරමග" දශක කණ්ඩායමේ සාමාජිකයෙකු සහ දම්පල් විදු පියසේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙකි. වර්තමානයේ Zeon & International ආයතන සමූහයේ හිමිකරු වන ඔහුගේ ජීවිත අභියෝග සහ අත්දැකීම් අපත් සමග බෙදාගත්තේ මේ ආකාරයෙනි.

## ඔබ ව්‍යාපාර ක්ෂේත්‍රයට අවතීර්ණ වූයේ කෙසේද?

කුඩා කල සිටම මට ව්‍යාපාර ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් තිබුණා. එමෙන් ම බොහෝ දුෂ්කරතා මැද ජීවිතය ජයගත් මිනිසුන්ගේ කතන්දර මගේ ජීවිතයට ආරෝපණය කරගෙන තිබුණා. කවුරුන් හෝ යටතේ සේවය කිරීමට වඩා මාගේ අදහස් වලින් රටට, සමාජයට වටිනා දේ කිරීමට තිබූ ආශාව මා ව්‍යාපාර ක්ෂේත්‍රය කෙරේ යොමු කළා කිව්වොත් නිවැරදියි.

## පාසල් යන අවධියේ ඔබ මොනවගේ චරිතයක්ද?

වැඩිහිටියන්ට, ගුරුවරුන්ට බොහොම අවනත කෙනෙක්. නමුත් දුර්වලකමක් ලෙස මා තුළ තිබුනු දෙයක් ජීවිතේ පසුකාලෙකදී මම තේරුම් ගත්තා. ඒ අසාධාරණයක් වෙන අවස්ථාවක ඉක්මනින් කිපෙන ගතිය. එයත් පාසල් සමයේ මගේ තිබූ චරිත ලක්ෂණයක්.

මීට අමතරව පාසැල් ළමුන් බොහෝ දෙනෙක් නොකරන පුරුද්දක් මට තිබුණා. ඒ ධර්මපාලයේ තිබුණ ළමා බැංකුවට මගේ මහන්සියෙන්ම එකතු කරගත් සල්ලි තැන්පත් කිරීම. මේක මම මාසිකව කළා. මේකෙන් මට තරුණ වයස වෙනකොටම මුදල් නාස්තියට වඩා ආයෝජනයේ සහ ඉතිරියේ වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබාගන්න හැකිවුණා.

## කුඩා කල සිටම ධර්මපාලයෙන් ලබාගත් පන්නරය ජීවිතයට කෙතරම් පිටිවහලක් වුනාද?

ඇත්තටම ධර්මපාලයෙන් ලද ශක්තිය, අභිමානය වචනයෙන් විස්තර කල නොහැකි දෙයක්. සෑමවිටම මට පාසැල, ගුරුමව්පියවරුන් උගත්කමට අමතරව ගුණ ධර්ම වල වැදගත්කම පැහැදිලි කළා. අද ව්‍යාපාර ක්ෂේත්‍රයේ නමක් දිනාගෙන අවංකව වැඩ කිරීම ධර්මපාලයෙන් මා ලද පන්නරය තුළින් ගොඩනගාගත් දෙයක්.

## අනාගත සිහින ජයගන්න මග බලාසිටින ළමා පරපුරට ඔබ ලබා දෙන උපදේශය කුමක් ද?

පළමුවෙන් ම අපි තේරුම් ගත යුතු වනුයේ අප සතු වටිනාකම් පිළිබඳවයි. අපි එකිනෙකාට වෙනස්. සියලු දෙනාටම සෑම හැකියාවක්ම ලැබෙන්නේ නෑ. උත්සහයෙන් යහපත් අරමුණු කරා ගමන් කලොත් ඕනෑම බාධකයක් ජය ගන්න පුලුවන්. ඒ වගේමයි ගුණධර්මයන්ගෙන් හෙබි අයෙකු වීමද වටිනවා. මේ සියලු දේවල් හරියට එකතු කලොත් ඕනෑම පුද්ගලයෙකුට මේ ලෝකෙයේ තියෙන අභියෝග ජයගන්න පුලුවන්.

## ඔබේ අනාගත අරමුණු ගැන කතා කලොත්?

මා ඉපදුන රටට ණය නැති මිනිසෙක් ලෙස සේවය කරලා මාගේ අදහස් හා ව්‍යාපාර දැනුම එකතුකොට මේ රට බබලවන එක මගේ තියෙන ලොකු සිහිනයක්. ඒ වගේම මම දැනට පවත්වන සමාජ සත්කාරක සේවා මීට වඩා පුළුල්ව කරන්නත් බලාපොරොත්තු වෙනවා.

✍ කල්පිත කෝදාමුල්ල



## අකුරු කළ සිතිවිලි...

තබන හැම පියවරක...
පෙර ලැබුණු පාඩුවා...
නැණ පහන් එලි කරන...
විදු මඩුන් බබලවා...
දහසක මිණ පහන්...
සියවසක් එකළු කෙරුමට....
එක්ව අත්වැල් බැඳන්
පෙරගමන් යමු නොසෙන...

කල්පිත කෝදාමුල්ල
LM 3158

එකම යායට පිපි හිනැහුණු
අරලියා මල් විසිරිලා
කෙළදොළෙන් පැහැපුණු අපේ සිත්
ඔහේ හැම තැන විසිරිලා
පාර මගතොට සරසවිය තුළ
හමුවුනාත් පන්තියේ මිතුකැල
මිතුරු දම තැ එදා තිබූ ලෙස
අමාත්‍යය අද එදා මාත්‍යය
පාසලේ අන්තිම දවසෙ අපි
ඉකිගසා හැඬුවා ඉතින්
මගේ මිතුරියෙ කවද මේ ලෙස
දුරස් වූයේ ඉතින්නන්

දිලිනි ලාංකිකා - LM 3280

අමාවක රෑ
තනි තරුව දිගා
නුරා පෙම් බස්
දෙඩූ අහසට
පුන් පොහෝ දා
සොඳුරු සඳවත
ආදරෙන් සපගත්
අපූරුව....

දිනේෂා ජයමාන්න
LM 3156

දම්පල් මව් තුරුලේ
අරලිය තුරු සෙවණේ
දැනුම් දැනුම් ලැබුණේ
ඔබ නිසයි දම්පල් මව්ණේ

සුන්දර ළමාවියේ
තුටින් අකුරු කෙරුණේ
සුබ ජයද ලැබුණේ
ඔබ නිසයි දම්පල් මව්ණේ

කුරිරු මේ සමාජයේ
යහපත් කෙනෙකු ලෙසිනේ
තුටින් දිවි ගෙවුණේ
ඔබ නිසයි දම්පල් මව්ණේ

අදත් දම්පල් සෙවණේ
එදා මෙන් සොයුරු පෙමිනේ
පෙරමග හා බැඳෙමිනේ
දම්පල් මවට තුති පුදමිනේ

අරුණි ලියනගේ
LM 3628

සුදුපාට අරලියා
මල් ගොමුව තුළ ගෙවුන
කෙදි කුවට සිතා මැද
අකුරු කළ කැකුළු විය
පන්ති කාමරය තුළ
ගෙවුණු කල ජීවිතය
බෙස් බැනුණු අතර රැඳ
අනාගාර මිතුරුදම
කාලයත් සමග නිමා වුවත්...
ඒ සොඳුරු ඉම
සිහිකරන හැම මොහොත
සුන්දරයි පාසල් මවුනි ඔබ....

තිළිණි ශාලිකා - LM 3634

දෛවය හරි පුදුමකාරිය
සමහර අයව
අපේ ජීවිතයට ලං කරනවා
අපිට ඒ අයව නැතිව බැරි තරමට
ඒ වගේම, නොසිතූ මොහොතක
ඒ අයව
අපෙන් ඈත් කරනවා
වේදනාව විතරක් ඉතිරි කරමින්...

රුක්ෂාන් - LM 3310

සිනහා නගපු - සිහින දැනපු
වැටුණු අරලිය මල් දැගෙ අවිදපු..
සොයුරු පෙමින් සැරසුනු
මිතුදම් බිඳුනු...
නැණ එකපු - ලොව දිනපු
දිවියම හැඩ කරපු
අපේ දම්පල් මව් ,,
ඔසවා තබමු ගව්...
ඈවිද යමු ආයෙමත්
ඒ මතකවත් අගෙ...
නැතත්නට අත්වැලම්
අපේම දුදරුවන්ගෙ
,, පෙරමග පාදන්නට...
අත්වැල් බැඳන් පෙරමග"
සොයුරු සොයුරියන් හා,

මේබලා නදිශානි - LM 3300

සියුම් තඹර විසිතුන එන
පිණිපොද පිරුවන පොලන්න
තුරු වැල් මල් එල බරවී
වැසි අයි ලබා පන ලබන්න
සිතත් සොයොත් ග හාඩ මැද
සුදු කඳුළස් ජනිත වන්න
සිසෙ සෙ දෙනු බැන දෙවිඳුන
දුව තුබ එන නවම් මහට

තිළිණි ඉෂාරි - LM 2149

# අතීත පිය සටහන්...

දිනෙන් දින ජය ලබමින් පුරා දශක හතක් මුළුල්ලේ සිය සිප් කිරෙන් දැයේ දූ දරුවන් පෝෂණය කරන අපගේ රම්‍ය දම්පල් මැණියන් සිය මහඟු මෙහෙවර උදෙසා පළමු අත්පොත් තබන්නේ වර්ෂ 1940 ක් වූ දෙසැම්බර් මස 08 වන ඉරිදා පස්වරු 4.30ට යෙදුණු සුබ මොහොතිනි. ශ්‍රී ලංකාව මේ වන විට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ව පැවැති අතර ලංකාවේ අධ්‍යාපනය භාර වී තිබුණේ එල්. මැක් ද රොබින්සන්ට ය. ඔහු ධර්මපාල විද්‍යාලය ස්වාධීන පාසලක් ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හෙයින් එවක ආනන්ද විද්‍යාලයේ විදුහල්පති වූ පී. ද එස්. කුලරත්න මහතා මෙය ආනන්ද විද්‍යාලයේ ම පන්නිපිටිය ශාඛාව බවත් එය තම අධීක්ෂණය යටතේ පවතින බවත් උපක්‍රමශීලීව පෙන්නුම් කර පාසල ආරම්භ කිරීමට කටයුතු සැලසුවේ උගත් සමාජයක වටිනාකම හොඳින්ම දන්නා හෙයිනි. ආරම්භයේදී ප්‍රධාන ශාලාව නිම වී තිබී ඇති අතර පොල් අතු වහල සහිත අර්ධ තාවකාලික ශාලා දෙකක් ගොඩනගා ශාලාවක්, පන්ති කාමර හතර බැගින් වන සේ ලෑලි වලින් වෙන් කරනු ලැබ තිබේ.

ධර්මපාලතුමාට අයත්ව තිබූ අක්කර 18යි පර්චස් 9ක් වූ අති රමණීය භූමි භාගයක ඉදිවූ ධර්මපාලයේ ආරම්භක විදුහල්පතිතුමන් වූයේ මහාචාර්ය ජේ. ඊ. ජයසූරිය මැතිතුමාය. ඇතුළත් වීමේ ලේඛනයේ පළමු අංකය ලබා විදුහලට ඇතුළත් වීමේ භාග්‍ය හිමි වූයේ පසු කලෙක කලාශූරි සම්මානයෙන් පිදුම් ලද මහා කලාකරු සෝමබන්දු විද්‍යාපති ශිෂ්‍යයාටය. පන්ති වල අධ්‍යාපන කටයුතු ආරම්භ වූයේ 1941 පෙබරවාරි 17 වන දින අතර එය සමන්විත වූයේ විශේෂ පන්ති හා 6 වැන්නේ සිට මැට්‍රිකියුලේෂන් දක්වා වූ පන්ති 8 කිනි. පන්ති කාමර අවම පහසුකම් වලින් යුතු වූ අතර තද වැසි දින වලදී පාසල වසා දැමීමට සිදුවිය. මෙසේ අවම පහසුකම් යටතේ අධ්‍යාපන කටයුතු සිදු කෙරුණද ගුරු භවතුන්ගේ හා සිසු දරුවන්ගේ අප්‍රතිහත කැපවීම නිසාම දිනෙන් දින තරඟ විභාගවලදී උසස් ප්‍රතිඵල ලබාගැනීමට සිසුන්ට හැකියාව ලැබිණි.

විෂය අධ්‍යාපනය සේම සෞන්දර්ය අධ්‍යාපනය හා ක්‍රීඩා සඳහා ද ප්‍රමුඛත්වය හිමිවී තිබුණි. සාහිත්‍ය සංගම් හා කලා සංගම් සාර්ථකව ක්‍රියාත්මක වූ අතර වාද විවාද, සංගීත සන්ධ්‍යා හා විවිධ ප්‍රසංග, කවි මඩු ආදිය ද සංවිධානය කෙරිණි. චිත්‍ර කලා සංගමය සෝමබන්දු විද්‍යාපති මහතා මෙහෙයවූ අතර එය බෙහෙවින් ජනප්‍රිය විය.

අක්කර හතරක පමණ වන විද්‍යාලයීය ක්‍රීඩා පිට්ටනිය මුළුමනින්ම ශ්‍රීමත් ඊ. සී. ඒ. ප්‍රනාන්දු මැතිතුමාගේ පරිත්‍යාගයක් වූ අතර පිට්ටනිය නිම වීමෙන් අනතුරුව ප්‍රේක්ෂකාගාරය ද තම වියදමින්ම තනා දීමට ශ්‍රීමත් ප්‍රනාන්දු මැතිතුමා ත්‍යාගශීලි විය. ක්‍රීඩා පිටිය සාදා නිම කිරීමෙන් පසු ක්‍රීඩා සඳහා සිසු සිසුවියන්ගේ උනන්දුව වැඩි වූ අතර නීල් ප්‍රනාන්දු, ජේ. ටී. එෆ්. අබේකෝන් හා සුමතිරත්න සිරිවීර යන ගුරු මහත්වරු මෙන්ම එම්. එම්. පෙරේරා, ටී. අරුද්ප්‍රගාසම්, රොෂෙල් ප්‍රනාන්දු හා සෝමා ගල්ගොඩගේ යන ගුරු මහත්මීන් සිසුන්ගේ ක්‍රීඩා පුහුණුව උදෙසා ඇප කැපවී ක්‍රියා කළහ.



එදා මෙදා තුර දම්පල් මැණියන්ගෙන් සිප් සතර හැදෑරූ බොහෝ පිරිසක් විවිධ ක්ෂේත්‍රයන් වලින් ලක් මාතාව බබලවා ඇත. මහාචාර්ය එල්සි වෙත්තසිංහ, කලාශූරි සෝමබන්දු විද්‍යාපති, ආචාර්ය රෝහණ වීරසිංහ, හිටපු අගවිනිසුරු ඊවා වනසුන්දර, අග්‍රාමාත්‍ය හා ජනාධිපති ලේකම් කේ. එච්. ජේ. විජයදාස, ආචාර්ය සෝමා එදිරිසිංහ, ආචාර්ය කේ. ඩී. පී. වික්‍රමසිංහ, ආචාර්ය තිස්ස අබේසේකර, විශේෂඥ වෛද්‍ය ලොකුබණ්ඩාර බෙලිගස්වත්ත, ජෙනරාල් රොහාන් දළුවත්ත, එයාර් චීෆ් මාෂල් ඔලිවර් රණසිංහ යනාදීන් ඉන් අතළොස්සකි. ධර්මපාල පුණ්‍ය භූමිය, දහස් සංඛ්‍යාත සිසුන්ට සිය ජීවිත ආලෝකමත් කර ගැනීමට මූලික පදනම ලබා දී ඇත.

ආරම්භයේදී පොල් අතු සෙවිලිකළ තාවකාලික ශාලා 02 කින් ඇරඹුණු අප විද්‍යාලය මේ වන විට සියලු පහසුකම් වලින් සපිරි ISO 9001 තත්ව සහතිකයෙන් පවා පිදුම් ලද ලක්දිව විශාලතම බෞද්ධ මිශ්‍ර පාසලයි. එදා සිට පැමිණි ගමන් මග කිසිසේත්ම මල් ඇතුරූ මාවතක පැමිණි ගමනක් නොවන අතර අනේකවිධ කම්කටොළු ජයගෙන ගුරු දෙගුරු, ශිෂ්‍ය, ආදි ශිෂ්‍ය යනාදී සැමගේ අප්‍රතිහත කැපකිරීම් වල සාඩම්බර ප්‍රතිඵලයකි. තවත් චිරාත් කාලයක් අප සදාදරණීය දම්පල් මෑණියන් යෙහෙන් වැජඹෙනු දැකීම සියලු ධර්මපාලීයන්ගේ ඒකායන අපේක්ෂාවයි.

ධර්මපාල විද්‍යාලය සිය දශක 07 ක දීර්ඝ ගමනේ දී දක්ෂ විදුහල්පතිවරු රැසකගේ මඟපෙන්වීමෙන් ඉදිරියටම ගොස් තිබේ. වර්තමානයේ විද්‍යාලය ජයග්‍රහණය කරා මෙහෙයවීමේ ප්‍රධාන නියමුවාණන් වන්නේ ඔෂාර පණ්ඩිතරත්න මැතිතුමාය. එතුමා හට සිය කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සියලු ශක්තිය ධෛර්ය ලැබේවා යන්න අපේ පැතුමයි.

✍ දිනේෂා ජයමාන්න

මූලාශ්‍ර :
පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය සිරිත
දිනේන්ද්‍රපාල සිරිවර්දන






**පෙර දැනුම් දීමකින් තොරව මිල ගණන් වෙනස් විය හැක.




# SCHOOL of MUSIC
## H O M A G A M A

- පාසල් විෂය නිර්දේශය (පෙරදිග/අපරදිග)
- **ABRSM Exams** *(Royal School of Music London Exams)*
- භාත්කණ්ඩේ සංගීත විශාරද විභාග
- ජාතික සංගීත විභාග


**ලිඛිත/ප්‍රායෝගික කුඩා කණ්ඩායම් පන්ති**
**වයස අවු. 07න් ඉහළ දරු දැරියන් සඳහා**

---

වයලීන්, ගිටාර්, තබ්ලා
ඕගන්, පියානෝ



මෙහෙයවීම
**විශාරද අරුණී ලියනගේ**



මෙහෙයවීම
**විශාරද මහේෂ් ඒකනායක**

NO. 06, GALAWILA ROAD, HOMAGAMA.
0772 286 477 | 0112 895 095

**PAST PUPILS ASSOCIATION**
DHARMAPALA VIDYALAYA
PANNIPITIYA